# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2019

උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

**උසස් අධ්‍යාපන**

உயர்கல்வி, தொழில்நுட்பம் மற்றும் புத்தாக்க அமைச்சர

**உயர் கல்வி**

Ministry of Higher Education, Technology and Innovations

**Higher Education**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# 2019

උසස් අධ්‍යාපන



# ලේකම්තුමාගේ පණිවුඩය

අප සතුවන මානව සම්පත සාක්ෂරතාවයෙන් කලාපයේ ඉහළ තැනක වැජඹුනද, එහි සැබෑ ප්‍රයෝජනය ගැනීමට කාලය එළඹ ඇත. උසස් අධ්‍යාපනය වූ කලී රටක ඉදිරි ගමන් මඟ සැකසීමේ ගාමක බලවේගය යි.

ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය බිම් මට්ටමේ සිට ම විභාග කේන්ද්‍රීයව විකාශනය වුණු පරිසරයක් තුළ උසස් අධ්‍යාපනයේ දිශානතිය ද නිවැරදිව සකසා ගැනීමේ අඩුපාඩු පසුගිය කාලයන්හි අප අත්වින්දෙමු. විශේෂයෙන් ම රැකියා වෙළඳපොළ සහ උසස් අධ්‍යාපනයේ නොගැලපීම් වැඩි වශයෙන් පැන නැඟීම තුළ විරැකියාව සහ උගත්කම මැනවින් ගලපා ගන්නට අප අපොහොසත් වීමු. නමුත් ක්‍රමික ව එහි ගැලපීම් නිර්මාණය වන නව වටපිටාවක් තුළ රට පිළිබඳ අපට නවමු බලාපොරොත්තු දල්වා ගත හැකි ය.

උසස් අධ්‍යාපනය, නවෝත්පාදන, විද්‍යා හා තාක්ෂණ ආදී වූ එකට සබැඳි ආනුශංගයන් හි ඒකරාශී වීම ම උසස් අධ්‍යාපනයේ නව මංපෙත් විවරවීම පිළිබඳ සුබ සලකුණකි. බුද්ධියෙන් සහ දැනුමෙන් සුපෝෂිත තරුණ පරපුරක් අනාගතය උදෙසා පෙළ ගැස්වීම අතිගරු ජනාධිපතිතුමාගේ ද අපේක්ෂාව වී තිබේ. රට සෞභාග්‍ය කරා ගෙන යන සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති ඵල දරන දින උසස් අධ්‍යාපනයේ සැබෑ දායකත්වය රටට ම පසක් කළ හැකි ය.

ජාතික මෙන් ම ජාත්‍යන්තර මට්ටමේ විද්‍යාර්ථියකු උසස් අධ්‍යාපනය තුළින් බිහි කිරීම පමණකුදු නොව ඔහු සමාජය පිරිසිඳ දකින, මනුෂ්‍යත්වයට ආමන්ත්‍රණය කරන සමාජ සංවේදී පුරවැසියෙකු ලෙස සියල්ල සමඟ රැකියා වෙළඳපොළ සමඟ නොබිය ව තරඟ කළ හැකි තත්ත්වයට පත්කර ගැනීම අපේ අරමුණ යි.

අනුර දිසානායක,
ලේකම්,
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය.

## පටුන

**1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ....................................01 - 58**

1.1. උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම ........................................................01

1.2. උසස් අධ්‍යාපන අංශයේ දැක්ම/මෙහෙවර/අරමුණු ........................................................01

1.3. උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය ........................................................01

1.4. උසස් අධ්‍යාපන අංශයේ කාර්යය මණ්ඩලය-2019.12.31 දිනට ..................................02-03

1.5. ආංශික කාර්යය සාධනය........................................................04-57

1.5.1 පාලන අංශය ........................................................04-11

1.5.2 ගිණුම් අංශය ........................................................12-15

1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය ........................................................16-19

1.5.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ........................................................20-24

1.5.5 සංවර්ධන අංශය ........................................................24-33

1.5.6 සැලසුම් අංශය ........................................................33-37

1.5.7. අභ්‍යන්තර විගණන අංශය ........................................................38-40

1.5.8 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය........................................................41-48

1.6 සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය 2019 ........................................................49-58

1.6.1 ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රගතිය ........................................................49-56

1.6.2 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අයවැය යෝජනා ව්‍යාපෘති ...............57-58

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........................................................ 59**

**3. පරිච්ඡේදය - 2019.12.31න් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය ......... 60-64**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය........................................................60-61

3.2 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය ........................................................61–62

3.3 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය ........................................................62-63

3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ............................ 64

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........................................ 64

**4. පරිච්ඡේදය- කාර්ය සාධන දර්ශක ........................................................ 64**

**5. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය ........................... 65-66**

**6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ........................................................ 66-69**

**7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ........................................................ 69-76**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 උසස් අධ්‍යාපන අංශය පිළිබඳ හැඳින්වීම

විවිධ විෂය ධාරා හදාරමින් වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන් අතරින් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපනය ලැබීමට සඳහා ඇතුලත් වන්නන් සඳහා පහසුකම් සැලසීම මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක විමට මෙන්ම ජාත්‍යන්තර රැකියා වෙළඳපලට ප්‍රවේශ වීමට අවස්ථාවන් ලබා ගැනීමේ ප්‍රධාන අරමුණින් උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන් සොයා යන්නන් සඳහා උසස් අධ්‍යාපනය ලබා දීමේ ප්‍රධාන වගකිම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ. එම අරමුණ මුදුන්පත් කර ගැනිමේදී උසස් අධ්‍යාපනය සඳහා ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීමේ සිට රාජ්‍ය විශ්වවිද්‍යාල තුල නව පීඨ සහ දෙපාර්තමේන්තු ස්ථාපිත කිරීම තුලින් අධ්‍යයන අවස්ථා ඉහළ නැංවීම මෙන්ම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධතිය නියාමනය කිරීම දක්වා වූ කර්තව්‍යයන් රැසක් අමාත්‍යාංශය හරහා සිදු වේ. එමෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවිම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකවීම දක්වා අමාත්‍යාංශයේ කාර්ය භාරය විහිදී යයි. මෙම කාර්ය භාරය ඉටුකිරීම 2019 ආරම්භයේ සිට 2019 නොවැම්බර් 22 දින දක්වා නගර සැලසුම්,ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතෙහි ද නොවැම්බර් 22 දින සිට උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතෙහි ද ක්‍රියාත්මක විය.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම

**මෙහෙවර**

ප්‍රතිඵල අරමුණු කොටගත් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම

**අරමුණු**

- උසස් අධ්‍යාපනය වෙත ප්‍රමාණවත් ප්‍රවේශ අවස්ථා සැලසීම
- ගුණාත්මය සහ අදාළත්වය ඉහළ නැංවීම
- පර්යේෂණ ප්‍රතිඵල සහ නවෝත්පාදනය තුළින් ජාතික ආර්ථිකය සඳහා දායක වීම
- තොරතුරු තාක්ෂණය පදනම් කොටගත් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම

## 1.3 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන ව්‍යුහය පිළිබඳව සලකා බැලීමේ දී, අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාල 15ක්, (සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල 14ක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලය මීට අයත් වේ) උසස් අධ්‍යාපන ආයතන 10ක් සහ පශ්චාත් උපාධි ආයතන 08ක් පවතී. එසේම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වේ.

## 1.4 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2019.12.31 දිනට

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | 1 | 1 | 0 |
| | | අතිරේකලේකම් (පාලන හා මුදල්) | 1 | 1 | 0 |
| | | අතිරේක ලේකම් (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | 0 |
| | | අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | 0 |
| | | ප්‍රධාන මුල්‍ය නිලධාරී | 1 | 1 | 0 |
| | | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 1 | 0 |
| | | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| | | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| | | ඉංජිනේරු (සිවිල්) | 1 | 1 | 0 |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව / කුසලතා සංවර්ධන ) | 2 | 1 | 1 |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | 0 |
| | | නි.අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ (සැලසුම්) | 2 | 2 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) | 1 | 1 | 0 |
| | | නීති නිලධාරි | 1 | 1 | 0 |
| | | ගණකාධිකාරී | 1 | 1 | 0 |
| | | සහකාර ලේකම් | 2 | 0 | 2 |

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (ii) | තෘතියික | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| | | භාෂා පරිවර්තක | 2 | 1 | 1 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 1 | 1 | 0 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී ( ශිෂ්‍ය ණය අංශය ) | 2 | 0 | 2 |
| (iii) | ද්විතියික | සංවර්ධන නිලධාරි | 80 | 31 | 49 |
| | | සංවර්ධන සහකාර | 9 | 1 | 8 |
| | | සැපයුම් සහකාර | 1 | 1 | 0 |
| | | ප්‍රවෘත්ති නිලධාරි | 1 | 1 | 0 |
| | | කාර්මික නිලධාරි | 1 | 0 | 1 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 36 | 34 | 2 |
| | | නිශ්චල ඡායාරූප ශිල්පි | 1 | 0 | 1 |
| | | කැමරා ශිල්පි | 1 | 0 | 1 |
| | | පිළිගැනීමේ නිලධාරී | 1 | 0 | 1 |
| | | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 0 | 1 |
| (iv) | ප්‍රාථමික | කාර්යාල කාර්ය සහයක | 22 | 20 | 2 |
| | | රියදුරු | 22 | 19 | 3 |
| | | කැමරා ක්‍රියාකරු සහායක | 1 | 1 | 0 |
| එකතුව | | | 210 | 134 | 76 |


*2019.12.31 දිනට උපාධිධාරී අභ්‍යාසලාභීන් 32ක් මෙම අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරනු ලැබේ.

# 1.5 ආංශික කාර්ය සාධනය

## 1.5.1 පාලන අංශය

උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මඟින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම සහ පවත්වාගැනීම සඳහා අමාත්‍යාංශයේ අභිමතාර්ථ සහ කාර්යයන් වලට ගැලපෙන උසස් තත්ත්වයක් සහිත ප්‍රශස්ථ සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අඛණ්ඩ සහ ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධිකරණයක් ඇති කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක පහසුකම් නංවාලීම සහ අමාත්‍යාංශයේ සමස්ත පරිපාලනය, මෙහෙයවීම සහ ඇගයීම නංවාලීම පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ.

**සංවිධාන සටහන**



**1.5.1.1පාලන අංශයේ කාර්යභාරය**

- දෛනිකව අමාත්‍යාංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලයෙන් හා විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාල පාර්ශව වෙත යැවීම සඳහා පියවර ගැනීම.
- අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.
- අමාත්‍යාංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම,ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම .
- අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි,යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම
- අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරි දුරකතන බිල්පත් පියවීම
- අමාත්‍යාශ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර,වීසා,VIP,ගමන් වියදම් හා දීමනා ලබාදීම පිලිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ණය ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම.
- මාසික දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර ( warrants)නිකුත් කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවලදී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- උසස් අධ්‍යාපන අංශයෙහි කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම්
- උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම් හා සේවය අවසන් කිරීම්
- බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතනයන්හි හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු විශ්වවිද්‍යාල ආචාර්යවරු සඳහා සහනදායී මෝටර් බලපත්‍ර නිකුත් කිරීම
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අනධ්‍යන කාර්ය මණ්ඩල පත් කිරීම හා පුරප්පාඩු පිරවීම
- විශ්වවිද්‍යාල සඳහා විදේශීය ආචාර්යවරුන් කොන්ත්‍රාත්/ තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම

- විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද්විතීයන පදනම මත තාවකාලිකව/ ස්ථිරව මුදා හැරීම
- විශ්වවිද්‍යාල පද්ධතියේ දීමනා සම්බන්ධ මහා භාණ්ඩාගාරය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් විෂමතා පිළිබඳව නිර්දේශ ලබා දීම
- විදේශ ආධාර හා ණය මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම හා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම

### 1.5.1.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 876 චක්‍රලේඛයට අදාලව විශ්වවිද්‍යාල සහ ආයතනවල තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දුන් සංඛ්‍යාව

2019 වර්ෂය තුළදී සියළුම විශ්වවිද්‍යාල සහ ආයතන සඳහා තනතුරු 2,014 ක පුරප්පාඩු පිරවීම අනුමත කර ඇත.

| විශ්වවිද්‍යාලය හෝ ආයතනය | සංඛ්‍යාව |
|---|---:|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 56 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 305 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 151 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 180 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 89 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 58 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 40 |
| රජරට විශ්වවිද්‍යාලය | 62 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 93 |
| යාපනය විශ්වවිද්‍යාලය | 227 |
| වයඹ විශ්වවිද්‍යාලය | 82 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 70 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 10 |
| සෞන්දර්යකලා විශ්වවිද්‍යාලය | 74 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 15 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 45 |
| සෞන්දර්ය අධ්‍යනය පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලය | 24 |
| ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය | 01 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 01 |
| මානව සම්පත් අභිවර්ධන ආයතනය | 06 |
| කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 22 |
| ජෛව රසායන අනුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය | 14 |
| පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 04 |
| කොළඹ විශ්වවිද්‍යාලය පරිගණක පාසල | 01 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 21 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 10 |
| ශ්‍රී ලංකා යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය | 35 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය | 02 |
| තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය | 51 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 05 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 130 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 96 |
| දේශිය වෛද්‍ය විද්‍යා ආයතනය | 34 |
| **එකතුව** | **2,014** |

### 1.5.1.3 දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් 2019 වර්ෂය තුළදී දේශීය හා විදේශීය පුහුණු සඳහා යොමු කර ඇති අතර අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් සඳහා දේශීය පුහුණු අවස්ථා ලබාදී ඇත.

**දේශීය පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | අමාත්‍යාංශයෙන් දරන ලද වියදම (රු) |
|---|---|---|---|
| දේශීය පුහුණු වැඩසටහන් | 14 | 105 | 821,000.00 |

**විදේශීය පුහුණු /සම්මන්ත්‍රණ වැඩසටහන්**

| පුහුණු වැඩසටහන් පවත්වන ලද රට | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් ගණන | අමාත්‍යාංශයෙන් දරන ලද වියදම |
|---|---|---|---|
| චීනය | 02 | 05 | ඇ. ඩො.4,006 |
| මැලේසියාව | 02 | 02 | ඇ. ඩො.925 |
| තුර්කිය | 01 | 01 | ඇ. ඩො. 200 |
| කොරියාව | 01 | 01 | ඇ. ඩො. 240 |
| නේපාලය | 01 | 01 | ඇ. ඩො. 300 |
| පකිස්ථානය | 01 | 01 | ඇ. ඩො. 520 |
| තායිලන්තය | 01 | 01 | ඇ. ඩො. 340 |
| මාලදිවයින | 02 | 02 | ඇ. ඩො. 495 |
| ස්වීඩනය | 01 | 01 | ඇ. ඩො. 4,235 |

### 1.5.1.4 සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017.06.01 දින නිකුත් කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපතිපත්ති චක්‍රලේඛ අංක.01/2016 (II) හා 2018.02.15 දින නිකුත් කරන ලද 01/2018 චක්‍රලේඛය 2018.06.08 දින නිකුත් කරන ලද 01/2018 (I) චක්‍රලේඛ අනුව මෙම අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කරන ලදී.ඒ අනුව රාජ්‍ය සේවයේ,මෙම අමාත්‍යාංශය යටතේ පවතින විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා අනෙකුත් උපාධි ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවල,අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක සේවය කරන සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා ඉහත සඳහන් චක්‍රලේඛ යටතේ 2019 වර්ෂයේදී නිකුත් කරන ලද සහනදායි මෝටර් රථ බලපත්‍ර පහත වගුවේ සඳහන් වේ.

| විශ්වවිද්‍යාලය/ආයතනය | නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | උසස් අධ්‍යාපන,තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය | මුළු ගණන |
|---|---|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 135 | 15 | 150 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 90 | 05 | 95 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 88 | 10 | 98 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 81 | 03 | 84 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 115 | 08 | 123 |
| යාපනය විශ්වවිද්‍යාලය | 41 | 12 | 53 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 48 | 05 | 53 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 59 | 02 | 61 |
| ශ්‍රී ලංකා සබරගමුව වි.වි | 31 | 07 | 38 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 22 | 04 | 26 |
| ශ්‍රී ලංකා නැගෙනහිර වි.වි | 48 | 04 | 52 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 28 | 03 | 31 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 37 | | 37 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අ.ආ | 31 | | 31 |
| සෞන්දර්යය කලා වි.වි | 23 | 04 | 27 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි වි.වි | 06 | - | 06 |
| ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස වි.වි | 18 | 03 | 21 |
| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 26 | 01 | 27 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කො.ස | 02 | - | 02 |
| වව්නියා මණ්ඩපය-යාපනය වි.වි | 03 | - | 03 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය | 06 | 06 | 12 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 06 | - | 06 |
| ශ්‍රීපාලි මණ්ඩපය- කොළඹ වි.වි | 04 | - | 04 |
| තාක්ෂණ ආයතනය-මොරටුව වි.වි | 06 | 01 | 07 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආ. | 02 | - | 02 |
| මානව සම්පත් අභිවර්ධන ආ. | 01 | - | 01 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය | 01 | 01 | 02 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය | 01 | - | 01 |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය | 01 | - | 01 |
| ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව | 01 | - | 01 |
| ජෛව රසායන විද්‍යා අණුක ජීව විද්‍යා සහ ජෛව රසායන ආයතනය | 01 | - | 01 |
| නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 03 | - | 03 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 65 | - | 65 |
| **මුළු ගණන** | **1,031** | **94** | **1,125** |

### 1.5.1.5 රාජකාරි විදේශ ගමන් බලපත්‍ර

අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුලු රාජකාරි විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2019 වර්ෂය තුළ පහත පරිදි රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

| අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | එකතුව |
|---|---|---|
| - | 26 | 26 |

### 1.5.1.6 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන ආරාධිත ආචාර්ය වරුන්ගේ සේවාව ලබා ගැනීම

| විශ්වවිද්‍යාලය හෝ ආයතනය | සංඛ්‍යාව |
|---|---|
| යාපනය විශ්වවිද්‍යාලය | 05 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 02 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 01 |
| එකතුව | 08 |

### 1.5.1.7 2019 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභා

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 93 |
| 2019.12.31 දක්වා තීරණ ලැබී නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 21 |
| පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | 10 |
| පිළිතුරු සපයා ඇති ස්ථාවර නියෝග යටතේ අසනු ලබන ප්‍රශ්න | 03 |
| 2019 වර්ෂය තුළ මහජන පෙත්සම් කාරක සභාවෙන් ලැබුණු ලිපි | 05 |
| 2019 වර්ෂය තුළ වාර්තා යවන ලද මහජන පෙත්සම් කාරක සභා ලිපි | 05 |

### 1.5.1.8 තොරතුරු පනත අනුව ක්‍රියා කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධව 2019 වර්ෂය තුළ ක්‍රියා කිරීම පහත සාරාංශ කර ඇත.

| වර්ෂය තුළදී ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව | සපයන ලද තොරතුරු ප්‍රමාණය | වෙනත් ආයතන වෙත යොමු කරන ලද තොරතුරු ප්‍රමාණය | 2019 වර්ෂයේ අභියාචන සංඛාව |
|---|---|---|---|
| 39 | 22 | 17 | 07 |

### 1.5.1.9 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ වාර්ෂික ගිණුම් හා පාලන වාර්තා

උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින විශ්වවිද්‍යාල, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයද ඇතුළුව ආයතන 39ක වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

| වර්ෂය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 2019 | සාකච්ඡා කිරීමෙන් පසු, භාෂාත්‍රයෙන් එවීමට ලිපි යවා ඇති වාර්ෂික වාර්තා | 09 |
| | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා | 12 |
| | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා | 10 |
| | පාර්ලිමේන්තුව වෙත භාර දී ඇති වාර්ෂික වාර්තා | 08 |
| | එකතුව | 39 |

### 1.5.1.10 ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ඇතුළු සියළුම නඩත්තු වියදම්

| කාර්යය | 2019 වසරේදී දරන ලද වියදම සහ පියවන ලද බිල්පත් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂක සේවා | රු. 3,983,820.49 |
| සනීපාරක්ෂක සේවා | රු. 4,424,474.65 |
| තැපැල | රු. 347,494.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | රු. 824.749.85 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම් | රු. 1,587,530.97 |
| විදුලිය | රු. 6,081,379.08 |
| ජලය | රු. 362,581.90 |
| කාර්යාල දුරකථන හා ෆැක්ස් | බිල්පත් 950 |
| අමාත්‍යාංශ අන්තර්ජාල සම්බන්ධතා | බිල්පත් 48 |

### 1.5.1.11 ප්‍රවාහන පහසුකම් සැපයීම

2019 වර්ෂයේදී අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම

| කාර්යය | 2019 වර්ෂයේ වියදම (රු.) |
|---|---|
| සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම හා අතිරේක ඉන්ධන සැපයීම | 1,928,031.55 |
| වාහන අළුත්වැඩියා කිරීම | 4,868,268.94 |
| නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම, අතිරේක ඉන්ධන ලබා දීම හා ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම | 3,670,262.80 |
| වාහන රක්ෂණය කිරීම හා අදාළ බලපත්‍ර ලබා දීම සම්බන්ධ කටයුතු | 1,316,866.36 |
| දුම් පරීක්ෂණ | 29,700.00 |
| රියදුරන් සඳහා අතිකාල හා ගමන් වියදම් | 3,730,256,51 |
| වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි හා අනෙකුත් උපාංග සපයා දීම | 956,998.50 |
| එකතුව | 16,500,384.66 |

### 1.5.1.12 ණය

2019 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර


| ණය/අත්තිකාරම් වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 51 | 6,641,150.00 |
| විශේෂ අත්තිකාරම් | 23 | 92,000.00 |
| උත්සව අත්තිකාරම් | 72 | 720,000.00 |

## 1.5.1.13 2019 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්

| අනු අංකය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම සිදු කළ දිනය | විස්තරය |
|---|---|---|---|
| **1.** | 2019 නව වසරේ රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ උත්සවය | 2019.01.01 | **-** |
| **2.** | අමාත්‍යාංශය තුල එලදායිතා වැඩසහන ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සහ එහි ප්‍රතිලාභ පිලිබඳ අමාත්‍යාංශ ලේකම්තුමා විසින් අමාත්‍යාංශ නිළධාරීන්ව දැනුවත් කිරීම | 2019.01.28 | සෑම අංශයක්ම නියෝජනය වන පරිදි එලදායිතා කව පිහිටුවා එම කව නායකයන් හරහා එක් එක් අංශ වල එලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාකාරකම් සිදු කිරීම |
| **3.** | එලදායිතා වැඩසහන ක්‍රියාත්මක කිරීමට අදාල මූලික කරුණු පිළිබඳව හිටපු අමාත්‍යාංශ ලේකම් උපාලි මාරසිංහ මහතා විසින් අමාත්‍යාංශ නිලධාරීන්ව දැනුවත් කිරීම | 2019.02.27 | එලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කර අමාත්‍යාංශ පරිශ්‍රය ප්‍රියමනාප ස්ථානයක් බවට පත් කිරීමටත් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය නඟා සිටුවීමට සහ සේවා ලාභීන්ට තම සේවාවන් ඉටු කර ගැනීමටත් පහසු වන පරිදි අමාත්‍යාංශය සකස් කරමින් පවතී. |
| **4.** | මත්ද්‍රව්‍ය නිවාරණ සතියට සමගාමීව මත්ද්‍රව්‍ය හා මද්‍යසාර පිලිබඳ තොරතුරු මධ්‍යස්ථානයේ උපදේශකයෙකු සම්බන්ධ කරගෙන මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක් පැවැත්වීම | 2019.06.24 | මත්ද්‍රව්‍ය නිවාරණ සතියට සමගාමීව අමාත්‍යාංශය තුල මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවක් පිහිටුවා අමාත්‍යාංශය තුල මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය නවතා ඇත. |
| **5.** | එලදායිතා වැඩසහන පිළිබඳව ක්‍රියාත්මක කිරීම පිළිබඳව එලදායිතා කව නායකයන් සහ අංශ ප්‍රධානීන් වෙත එලදායිතා ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් පුහුණු වැඩසටහනක් පැවැත් වීම | 2019.08.20 | එලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කර අමාත්‍යාංශ පරිශ්‍රය ප්‍රියමනාප ස්ථානයක් බවට පත් කිරීමටත් නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය නඟා සිටුවීමට සහ සේවා ලාභීන්ට තම සේවාවන් ඉටු කර ගැනීමටත් පහසු වන පරිදි අමාත්‍යාංශය සකස් කරමින් පවතී. |
| **6.** | අල්ලස හා දූෂණය තුරන් කිරීම පිළිබඳ අමාත්‍යාංශ නිලධාරීන් වෙත පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන | 2019.10.29 | අල්ලස් හෝ දූෂණ නිවාරණ කොමිෂන් සභාවේ නිලධාරි මහත්මියකගේ සම්පත් දායකත්වය ඇතිව සියලුම අමාත්‍යාංශ නිලධාරීන් වෙත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. |

## 1.5.2. ගිණුම් අංශය

**සංවිධාන සටහන**




### 1.5.2. I උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා මූල්‍ය ආයෝජනය

2019 වර්ෂයේදී නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 166 යටතේ උසස් අධ්‍යාපන අංශය සඳහා රු. බිලියන 19.73 ක ප්‍රතිපාදන සලසා දෙන ලදී. එයින් රු. බිලියන 14.68 ක වියදමක් දරා 74% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

**2019.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය**

(රු.මිලියන)

| අයිතමය/විස්තරය | 2019 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **පරිපාලන හා ආයතනික සේවා** | **407.00** | **203.58** | **203.42** | **50.02** |
| පුද්ගල පඩිනඩි | 81.40 | 77.23 | 4.17 | 94.9 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 325.60 | 126.35 | 199.25 | 38.8 |
| **උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය** | **1,583.00** | **1,574.69** | **8.31** | **99.5** |
| එකතුව | **1,990.00** | **1,778.27** | **211.73** | **89.4** |

## 2019.12.31දිනට මූලධන වියදම් සාරාංශය

(රු.මිලියන)

| අයිතමය/විස්තරය | 2019 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **පරිපාලන හා ආයතනික සේවා** | **2,276.65** | **1,061.33** | **1,215.32** | **46.6** |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 25.10 | 25.10 | 0.00 | 100.0 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 24.97 | 24.97 | 0.00 | 100.0 |
| සේවක පුහුණු වැඩසටහන් | 1.00 | 1.00 | 0.00 | 100.0 |
| නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 511.00 | 504.83 | 6.17 | 98.79 |
| විශ්වවිද්‍යාල සිසුන් සඳහා පොලී රහිත ලැප්ටොප් ණය ව්‍යාපෘතිය | 200.00 | 122.25 | 77.45 | 61.1 |
| රුහුණ විශ්විවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 230.58 | 30.41 | 200.17 | 13.2 |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 10.00 | 7.00 | 3.00 | 70.0 |
| කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 20.00 | 3.00 | 17.00 | 15.0 |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 339.00 | 18.00 | 321.00 | 5.3 |
| කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 50.00 | 0 | 50.0 | 0.0 |
| රුහුණු විශ්වවිද්‍යාලයේ සාගර හා නාවික කටයුතු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 125.00 | 50.18 | 74.82 | 40.1 |
| තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 10.00 | 0 | 10.00 | 0.0 |
| කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය කටයුතු අධ්‍යයන ආයතනය සඳහා සහාය | 50.00 | 38.00 | 12.00 | 76.0 |
| කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 17ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 80.00 | 79.95 | 0.05 | 99.9 |
| අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති | 600.00 | 156.63 | 443.37 | 26.1 |
| **උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති** | **13,788.37** | **10,829.08** | **2,959.29** | **78.5** |
| සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 96.00 | 63.28 | 32.72 | 65.9 |
| ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම - කිලිනොච්චිය | 5.93 | 5.93 | 0.00 | 100.0 |
| කෘෂිකර්ම පීඨය ස්ථාපනය කිරීම - කිලිනොච්චිය | 4.04 | 4.04 | 0.00 | 100.0 |
| රුහුණු විශ්වවිද්‍යාලයේ කලාගාරය ඉදිකිරීම | 19.46 | 19.46 | 0.00 | 100.0 |
| වසෝ ඒෂියා ව්‍යාපෘතිය | 15.53 | 15.53 | 0.00 | 100.0 |
| පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම - යාපනය විශ්වවිද්‍යාලය | 1,551.81 | 1,480.48 | 71.33 | 95.4 |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය | 2,800.00 | 2,580.51 | 219.49 | 92.2 |

| අයිතමය/විස්තරය | 2019 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 865.50 | 723.72 | 141.78 | 83.6 |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 264.77 | 14.50 | 250.27 | 5.5 |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 2,279.50 | 184.48 | 2,095.02 | 8.0 |
| පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 12.58 | 12.58 | 0.00 | 100.0 |
| නැගෙනහිර වි.වි හා පේරාදෙණිය වි.වි සඳහා වෛද්‍ය උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය | 338.78 | 257.80 | 80.98 | 76.1 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 10.00 | 0.00 | 10.00 | 0.0 |
| මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය සඳහා ලබාගත් ණය පියවීම | 5,500.00 | 5,442.31 | 57.69 | 98.9 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණ වැඩසටහනක් සකස් කිරීමේ ව්‍යාපෘතිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 3.82 | 3.82 | 0.00 | 100.0 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය නෝර්විජියානු ආධාර පර්යේෂණ ව්‍යාපෘතිය | 2.09 | 2.09 | 0.00 | 100.0 |
| යුනිසෙෆ් සහයෝගිතා වැඩසටහන | 8.76 | 8.76 | 100.00 | 100.0 |
| PFIZER – Mumbai ව්‍යාපෘතිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 4.36 | 4.36 | 0.00 | 100.0 |
| Nephros International - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 4.43 | 4.43 | 0.00 | 100.0 |

(රු.මිලියන)

| අයිතමය/විස්තරය | 2019 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය** | **1,677.00** | **1,013.07** | **663.93** | **60.4** |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 1,097.00 | 606.00 | 491.00 | 55.2 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 300.00 | 184.17 | 115.83 | 61.4 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 280.00 | 222.90 | 57.10 | 79.6 |
| **එකතුව (මූලධන වියදම්)** | **17,742.02** | **12,903.48** | **4,838.54** | **72.7** |

## 2019 වර්ෂය සඳහා අක්මුදල් ලැබීම් විස්තර

| අග්‍රිම ගිණුම් අංකය | භාණ්ඩාගාරයෙන් හා වෙනත් මූලාශ්‍ර වලින් ලද අක්මුදල් ප්‍රමාණය (රු.) | වියදම් කරන ලද ප්‍රමාණය (රු.) | අක් මුදල් භාවිතයේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 7002/0000/00/099/00/0019000 | 6,966,036,228 | 6,966,036,228 | 100 |
| 7003/0000/00/0090/00/0019000 | 799, 000,000 | 796,502,461 | 99 |

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| | වියදම (රු.) | ලැබීම් (රු.) | හර ශේෂ (රු.) |
|---|---|---|---|
| 2019.12.31 දිනට සත්‍ය අගයන් | 9,167,839.70 | 5,391,266.56 | 18,771,581.15 |

- **ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය හා ගිණුම්කරණ කාර්යයන්**

| | කාර්යය | ක්‍රියාත්මක කල යුතු දිනය / කාල සීමාව | ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|---|
| 01 | මු.රෙ. 135 අනුව මූල්‍ය අධිකාරී බලය පැවරීම | 2019 වර්ෂය සඳහා අදාල අධිකාර බලය ලේකම්වරයාගේ අත්සනින් පවරා ඇත. | |
| 02 | රු. 500,000/-ට වැඩි මූලධන වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම | 1971 අංක 38 මුදල් පනත අනුව අධිකාරි බලය පැවරීමට කටයුතු කර ඇත. | |
| 03 | 2019 වාර්ෂික ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2020.02.28 දිනට පෙර | 2020.02.28 |
| 04 | 2019 පොදු තැන්පත් ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2020.02.28 දිනට පෙර | 2019.02.28 |
| 05 | 2019 රජයේ නිලධාරීන්ගේ ණය අත්තිකාරම් බී ගිණුම සකස්කර විගණකාධිපතිට ඉදිරිපත් කිරීම | 2020.02.28 දිනට පෙර | 2019.02.28 |
| 06 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2020.02.17 දිනට පෙර | 2019.02.14 |
| 07 | බැංකු සැසඳුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම | ඊළඟ මස 15 දිනට පෙර | ඊළඟ මස 15 දිනට පෙර |

- 2019 වර්ෂයට අදාලව අමාත්‍යාංශය සතු සියළුම වත්කම් තක්සේරු කොට ගිණුම් ගත කර ඇත. 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගත් භාණ්ඩ අපහරණය කිරීමේ කටයුතු ද 2019 වර්ෂය තුලදී අවසන් කර ඇත.
- 2019 වර්ෂයේ විගණන විමසුම් **7** ක් ලැබී ඇති අතර එම විමසුම් **7** සඳහා නියමිත කාලයේදී පිළිතුරු යවා ඇත.
- ගිණුම් අංශය මගින් මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම, වාර්ෂික ප්‍රතිපාදන වෙන්කර දීම, මාසික අග්‍රිම අවශ්‍යතාවයන්ට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන අදාල ආයතන වෙත නිකුත් කිරීම, අතුරු අග්‍රිම පවත්වා ගෙන යාම, අග්‍රිම සැසඳීම් සිදුකිරීම, පොදු තැන්පත් ගිණුම් හා ණය අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම, වවුචර් සඳහා ගෙවීම් කිරීමේ කාර්යයන්, සරප් කටයුතු ආදී දෛනික හා මාසික කාර්යයන් කාලානුරූපව අප්‍රමාදව ඉටුකර ඇත

**ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක කර ලද රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව**

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මුහුණ දෙන ගැටළු පිළිබඳව විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් හා ප්‍රසම්පාදන නිලධාරීන් දැනුම වර්ධනය කිරීමේ එක්දින වැඩමුළුවක් 2019 මාර්තු මස 8 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. අමාත්‍යාංශ ලේකම් ඇතුළු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන්, උපකුලපති වරුන් ඇතුළු විශ්වවිද්‍යාලයන්හි නිලධාරීන් මේ සඳහා සහභාගි වූහ. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ (ලෝක බැංකු ආධාර) ව්‍යාපෘතිය විසින් හැකියා වර්ධන කාර්යය යටතේ මූල්‍ය දායකත්වය ලබා දුන් මෙම වැඩමුළුවේ සම්පත් දායකත්වය ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රවීන දේශකයෙකු වන ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක අනුර ලොකුගමගේ මහතා විසින් ලබා දෙන ලදී.

## 1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය

**සංවිධාන සටහන**

අතිරේක ලේකම් (පාලන හා මුදල්)

අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන)

ඉංජිනේරු

සංවර්ධන නිලධාරි (05),
අභ්‍යාසලාභි උපාධිධාරි (01)

### 1.5.3.1 යටිතල පහසුකම් සංවර්ධන අංශයේ කාර්යභාරය

- සියලු වැඩ ප්‍රසම්පාදන කාර්යන් 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2019 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.
- ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව හා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සැලසී ඇති ප්‍රතිපාදන අනුව කාර්යක්ෂමව හා සඵලදායිව අදාල සේවාවන් සැපයීම
- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කර එවනු ලබන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යන ආයතනයන්ගෙන් ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමකට ලක්කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ ව්‍යාපෘති යෝජනා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- ව්‍යාපෘතිවලට අදාල රේට් අනුමැතීන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල වෙතින් ලැබෙන ලිපිලේඛණ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව මගින් ව්‍යාපෘතිවලට අදාල අනුමත කරන ලද ප්‍රමාණ පත්‍ර (BOQ) අදාල විශ්වවිද්‍යාලය වෙත යොමුකිරීම.
- 2019 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම
- 2019 ප්‍රසම්පාදන කාර්යයන් ඇරඹීම සඳහා අතිරේක ලේකම් (පාලන හා මුදල්) හා ලේකම්ගෙන් පූර්ව බලය ලබා ගැනීම.
- සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් ඇණවුම් කර සැපයීම.
- සියලු ප්‍රසම්පාදන කාර්යන් 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2019 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.

### 1.5.3.2. 2019 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් ඉටු කරන ලද කාර්යභාරය

#### 01. සේවා ප්‍රසම්පාදන

සේවා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් 2019 වර්ෂය තුල දී කරන ලද කාර්යයන්,

- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු, අමාත්‍යාංශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කර ලබාදීම.
- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කරගැනීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.
- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගෙන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම.

#### 02. උපදේශන සේවා

බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු අදාල ඉදිකිරීම් ආරම්භ කිරීම හා අවසන් කිරීම සඳහා දිර්ඝ කාලයක් ගත වන අවස්ථාද, එම ව්‍යාපෘති කාලය මෙන්ම පිරිවැය ද දෙගුණ වු අවස්ථා ද නිරීක්ෂණය විය. ඒ පිලිබඳ සොයා බැලීමේදී පෙනි ගියේ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ සුළු කාර්යයකදී පවා ඉතා විශාල කාලයක් ගත කර ඇති බවයි.

ඊට විසඳුමක් ලෙස අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිකිරීම් වර්ගීකරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව යෝජනා හා මිල ගණන් කැඳවා විශ්වවිද්‍යාල සඳහා අනුමත වන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශකවරුන්ගෙන් ලැයිස්තුවක් සකස් කර විශ්වවිද්‍යාල වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය වෙනුවෙන් අධික කාලයක් වැය කොට විශ්වවිද්‍යාල සඳහා උපදේශකවරු පත්කර ගැනීම වෙනුවට වැඩි කාලයක් ගත නොකට මෙම ලැයිස්තුවෙන් උපදේකවරුන් තෝරා ගෙන කඩිනමින් නිර්මාණ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවකාශ සැලසී ඇත.

#### 03. භාණ්ඩ සැපයුම් හා සේවා ප්‍රසම්පාදන

භාණ්ඩ හා සේවා සැපයුම් සම්බන්ධයෙන් 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා කරන ලද කාර්යයන්,

- සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් ඇණවුම්කර සැපයීම සඳහා 2019 වසරේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කිරීම.
- ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සැපිරීමට සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශ සුළු හා ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි ලබාදීම.
- ලංසු ලියකියවිලි සකස් කිරීම.

- ලංසු ලබාගැනීම සඳහා දැන්වීම පළකිරීම, මිල ගණන් කැඳවීම.
- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කිරීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.
- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගැනීම.
- ප්‍රසම්පාදනයන් සඳහා අනුමැතිය ලද පසු භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීම.
- ඇණවුම් කරන ලද භාණ්ඩ හා උපකරණ නියමිත දිනට ගෙන්වාගෙන ගබඩාව වෙත යොමු කිරීම.
- ගබඩාවෙන් සැපයුම්කරුගේ බිල්පත හා භාණ්ඩ ලැබීම් තුණ්ඩුව ප්‍රසම්පාදන අංශයට ලැබීමෙන් පසු වවුචර් පත් සකසා ගෙවීම් සඳහා පාලන අංශය වෙත යොමු කිරීම.
- අදාල භාණ්ඩ පිළිබඳ ලැබෙන වගකීම් සහතිකපත් පාලන අංශය වෙත යොමු කිරීම.
- සුළු මුදලින් මිලදීගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු කිරීම.
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතන සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු හා උපදේශන ප්‍රසම්පාදන කමිටු පත්කිරීම.

2019 වර්ෂය තුල අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් රු.බිලි.6.2 වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 13 ක ප්‍රසම්පාදන ආරම්භ කර ඇත.

| විශ්ව විද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ව්‍යාපෘති කාලය (මාස) | ව්‍යාපෘති වටිනාකම රු. මි |
|---|---|---|---|---|---|
| යාපනය | Siddha medicine ඒකකයේ 4 හා 5 වන මහල් සම්පූර්ණ කිරීම | 19.05.07 | 19.05.31 | 12 | 130.10 |
| | වව්නියා මණ්ඩපයේ ව්‍යාපාර අධ්‍යයන ගොඩනැගිල්ල ඉදිකිරීම | 19.05.07 | 19.05.31 | 32 | 926.00 |
| | වව්නියා මණ්ඩපයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම | 19.05.07 | 19.05.31 | 24 | 584.00 |
| | තෙමහල් සේවක නිවාස සංකීර්ණය ඉදි කිරීම | 19.05.07 | 19.05.31 | 24 | 350.00 |
| | ඉංජිනේරු තාක්ෂණ හා ජෛව තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 19.05.07 | 19.05.31 | 24 | 645.00 |
| | අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදි කිරීම | 19.05.07 | 19.05.31 | 6 | 200.00 |
| කැළණිය | කළමණාකරන හා වාණිජ විද්‍යා පීඨය සඳහා මහල් 10ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 19.05.07 | 19.05.31 | 36 | 1,417.00 |
| පේරාදෙණිය | ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 19.05.07 | 19.05.31 | 18 | 188.04 |
| ශ්‍රී ජයවර්ධනපුර | මහල් 7කින් යුතු බහු කාර්යය ගොඩනැගිල්ලෙහි මහල් තුනක් ඉදිකිරීම (අදියර 1) | 19.05.07 | 19.05.31 | 24 | 355.50 |
| | වෛද්‍ය පීඨයේ ව්‍යාධිවේදී පීඨය සඳහා කාය ව්‍යවච්ඡේද ගොඩනැගිල්ලට දිගුවක් ඉදිකිරීම | 19.05.07 | 19.05.31 | 20 | 156.00 |
| මොරටුව | වාස්තු විද්‍යා පීඨයේ දේශන ශාලා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම | 19.01.29 | 19.02.05 | 18 | 150.00 |
| | ඉංජිනේරු පීඨයේ බහු කාර්යය ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ නිම කිරීම | 19.01.29 | 19.02.05 | 18 | 200.00 |
| සබරගමුව | කෘෂිකාර්මික විද්‍යා පීඨය සඳහා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම (අදියර 1) | 19.01.29 | 19.02.05 | 30 | 976.00 |
| එකතුව | | | | | 6,277.64 |


2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් රු. බිලියන 8.1 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 18 ක කොන්ත්‍රාත් පිරිනමා ඇත.

| විශ්ව විද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ප්‍රසම්පාදන අවසන් කිරීම | ව්‍යාපෘති වටිනාකම රු. මි. |
|---|---|---|---|---|---|
| රජරට | නේවාසිකාගාර සංකීර්ණය සඳහා කසල අපවහන පද්ධතියක් ඉදිකිරීම | 17.03.28 | 17.04.20 | 19.09.05 | 200.40 |
| | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සඳහා පැරා සායනික ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.03.28 | 17.04.20 | 19.08.16 | 896.00 |
| | තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම | 17.07.04 | 17.07.20 | 19.05.02 | 438.00 |
| ඌව වෙල්ලස්ස | පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.01.16 | 18.02.08 | 19.05.15 | 476.00 |
| යාපනය | වව්නියා මණ්ඩපය සඳහා තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.02.14 | 18.03.02 | 19.06.17 | 467.36 |
| කැලණිය | සිවු මහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම | 19.01.29 | 19.02.05 | 19.12.30 | 247.00 |
| වයඹ | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨ ගොඩනැගිල්ල දීර්ඝ කිරීම | 16.11.08 | 16.11.29 | 19.02.14 | 215.30 |
| රුහුණ | ඉංජිනේරු පීඨය සඳහා නාවික අධ්‍යනය හා නාවික කටයුතු පිළිබඳ උපකරණ සහිත දක්ෂිණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 18.04.03 | 18.05.02 | 19.05.15 | 943.00 |
| | තාක්ෂණ පීඨය සඳහා ලීබඩු සහිත තෙමහල් දේශන ශාලාව | 18.02.14 | 18.02.28 | 19.05.15 | 413.00 |
| | වෛද්‍ය පීඨය සඳහා නව මහාචාර්යය ඒකකය ස්ථාපිත කිරීම සඳහා මහල් 10ක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම | 18.04.03 | 18.05.02 | 19.06.17 | 1,300.00 |
| පා. බෞ. පශ්චාත් උ. | මහල් හතරක ගොඩනැගිල්ලක් (අදියර 1) ඉදිකිරීම | 18.02.14 | 18.02.28 | 19.04.17 | 365.00 |
| විවෘත | සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා මහල් 5ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.07.04 | 17.07.19 | 19.06.17 | 402.50 |
| බෞද්ධ හා පාලි | කොළඹ කාර්යාලය සඳහා පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.10.04 | 19.10.19 | 19.08.16 | 307.50 |
| | විදේශීය සිසුන් සඳහා මහල් 4ක නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.10.04 | 19.10.19 | 19.09.02 | 219.00 |
| කොළඹ | යෝජිත උපකාරක කලාපය ඉදිකිරීම | 17.03.28 | 17.04.19 | 19.08.21 | 530.00 |
| අග්නිදිග | අධ්‍යන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීම | 18.07.03 | 18.07.18 | 19.11.04 | 344.70 |
| මොරටුව | යාන්ත්‍රික ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.03.28 | 17.04.19 | 19.07.04 | 247.00 |
| ශ්‍රීපාලි මණ්ඩපය | පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.11.08 | 16.11.29 | 19.07.23 | 149.97 |
| එකතුව | | | | | **8161.73** |

## 1.5.4. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ අංශය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එසේම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ කාර්යක්ෂමතාවය හා තත්වය ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන සැකසීම ආදී කටයුතු මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**සංවිධාන සටහන**




### 1.5.4.1. තොරතුරු හා සන්නිවේදන අංශයේ කාර්යභාරය

- මාර්ගගත විදේශ නිවාඩු අනුමත කිරීමේ පද්ධතිය පිලිබඳ පුහුණුව ලබා දීම
  - දැනට කොළඹ විශ්ව විද්‍යාලය , බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය, පේරාදනිය විශ්ව විද්‍යාලය , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය , කැලණිය විශ්ව විද්‍යාලය , මොරටුව විශ්ව විද්‍යාලය , රුහුණ විශ්ව විද්‍යාලය , රජරට විශ්ව විද්‍යාලය , වයඹ විශ්ව විද්‍යාලය , සෞන්දර්ය විශ්ව විද්‍යාලය , විවෘත විශ්ව විද්‍යාලය හා සියළුම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ පවතින පශ්චාත් උපාධි ආයතනවලට අවශ්‍ය පුහුණුවීම් පවත්වා ඇත.
  - අමාත්‍යාංශයේ නිලධාරින්ට අවශ්‍ය පුහුණුවීම් ද ලබා දී ඇත.
- 2019 තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කිරීම.
- 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ රාජකාරි කටයුතු සිදු කිරීම
- උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම
- පරිගණක වට්ටෝරු තොරතුරු පද්ධතිය (Computer Inventory Information System)
- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල wi-fi පහසුකම් තවදුරටත් පුළුල් කිරීම.
- අමාත්‍යාංශයේ ඇති පරිගණක, Laptop යන්ත්‍ර,Tabs සහ මුද්‍රණ යන්ත්‍ර වල දෘඩාංග දෝෂ නිරාකරණය.
- පරිගණකවල මෘදුකාංග දෝෂ අන්තර්ජාල හා e-mail වල ගැටළු නිවැරදි කිරීම.
- අංශවල අවශ්‍යතාවය අනුව පරිගණක වලට භාවිත මෘදුකාංග ඇතුලත් කිරීම, නඩත්තු කිරීම හා ගැටළු නිරාකරණය කිරීම .
- අමාත්‍යාංශයේ පරිගණක ආරක්ෂාව සඳහා වෛරස් මෘදුකාංග ඇතුලත් කිරීම හා යාවත්කාලීන කිරීම, වෛරස් කොන්සෝල් පද්ධතිය නඩත්තු කිරීම.
- පරිගණක ජාලය නඩත්තු කිරීම, ඊට අදාල ගැටළු විසඳීම හා අවශ්‍යතාවය අනුව ජාල සබඳතාවයන් පුළුල් කිරීම.

- පරිගණක ජාල පරිපාලක මධ්‍යස්ථානයේ ඇති Proxy Server, Firewall Server, e-mail server, Virus Console Server හා උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග Server යන Server යන්ත්‍ර පරිපාලනය උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග පද්ධතිය නඩත්තු කිරීම හා සංවර්ධන අංශයේ අවශ්‍යතාවය අනුව අදාල ආකෘති සකස් කර දීම.
- අමාත්‍යාංශයේ දැනට ස්ථාපිත Wi-Fi පද්ධතිය නඩත්තු කිරීම හා වරින් වර ඇතිවන තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම.
- අමාත්‍යාංශයට අවශ්‍ය පරිගණක දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමේදී තාක්ෂණික කමිටු නියෝජනය
- තොරතුරු තාක්ෂණ පද්ධති මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අවධිවලදී අනෙකුත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජනය කිරීම.
- ICTA මගින් ක්‍රියාත්මක කරන LGN ව්‍යාපෘතියේ කටයුතුවලට දායකත්වය ලබා දීම.
- අමාත්‍යාංශයේ පරිගණක හා තොරතුරු තාක්ෂණ උපාංග වලට අදාල වත්කම් ලේඛනය සකස් කිරීම.
- තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- අමාත්‍යාංශයේ CCTV කැමරා පද්ධතිය සවිකිරිම සම්බන්ධ රාජකාරිකාරි වලට සහය දැක්වීම.
- තාක්ෂණික පිරිවිතර සකස් කිරිම , TEC කමිටුවට දායකත්වය දීම, CCTV පද්ධතිය ස්ථාපනය කිරිමේ කටයුතු කළමණාකරනය කිරිම.
- අමාත්‍යාංශයේ CCTV කැමරා පද්ධතිය ක්‍රියා කරවීම හා නඩත්තු කිරිම.
- අමාත්‍යාංශයේ ශබ්ද විකාශන යන්ත්‍ර සවිකිරිම සම්බන්ධ කටයුතු වලට සහය දැක්වීම.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර දූරකථන අළුතින් සවිකිරිමේ කටයුතු වලට සහය දැක්වීම. (PABX System)

### 1.5.4.2. තොරතුරු හා සන්නිවේදන අංශය 2019 වර්ශයේ දී ඉටු කරන ලද කාර්යභාරය

**01. 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය ලබාදීම යටතේ 2019 වසරේ ණය ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගෙවා ඇති පොලී මුදල් ප්‍රමාණය**

| මාසය | ලංකා බැංකුව | | මහජන බැංකුව | |
|---|---|---|---|---|
| | සිසුන් සංඛ්‍යාව | පොලී මුදල් (රු) | සිසුන් සංඛ්‍යාව | පොලී මුදල් (රු) |
| ජනවාරි | 10,967 | 3,931,416.86 | 11,259 | 2,807,728.96 |
| පෙබරවාරි | 10,982 | 3,894,128.24 | 11,138 | 2,329,488.22 |
| මාර්තු | 10,986 | 3,616,162.99 | 11,032 | 1,966,120.11 |
| අප්‍රේල් | 11,020 | 3,879,437.04 | 10,906 | 1,865,251.21 |
| මැයි | 11,044 | 3,689,798.75 | 10,764 | 1,619,413.55 |
| ජූනි | 10,428 | 3,559,545.38 | 10,395 | 1,427,364.74 |
| ජූලි | 9,860 | 3,329,522.88 | 9,528 | 1,168,419.59 |
| අගෝස්තු | 9,356 | 3,224,566.14 | 8,299 | 977,839.63 |
| සැප්තැම්බර් | 8,793 | 2,940,138.72 | 6,867 | 811,378.98 |
| ඔක්තෝබර් | 8,281 | 2,695,650.33 | 5,673 | 643,113.25 |
| නොවැම්බර් | 7,795 | 2,580,814.83 | 4,538 | 537,027.98 |
| දෙසැම්බර් | 7,836 | 2,405,248.65 | 3,581 | 349,582.04 |
| එකතුව | **117,348** | **39,746,430.81** | **103,980** | **16,502,728.26** |

**02. උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම ඊට අදාළ නව තොරතුරු ඇතුලත් කිරීම.**

| අංශය | තොරතුරු | ප්‍රමාණය (සිංහල) | ප්‍රමාණය (ඉංග්‍රීසි | ප්‍රමාණය (දමිළ) |
|---|---|---|---|---|
| සංවර්ධන අංශය | දේශීය හා විදේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව, රාජ්‍ය සේවකයන් සඳහා විදේශීය පුහුණු සැසි හා දැන්වීම්. | 47 | 47 | 47 |
| අතිරේක(ලේකම්) සංවර්ධන | වෙබ් අඩවියේ මුහුණත් වෙනස් කිරීම් අලුත් අංග ඇතුලත් කිරීම හා වෙනත් වෙබ් අඩවි වලට සම්බන්ධ කිරීම. | 10 | 10 | 10 |
| මාධ්‍ය අංශය | මුල්ගල් තැබීම්, වැඩ බාර ගැනීම්, විවෘත කිරීම් සම්බන්ධ ජයාරූප හා ලිපි. | 40 | 40 | 40 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය. | ලැප්ටොප් පරිගණක පිළිබඳ මිළ ගණන් ලැයිස්තු, ශිෂ්‍ය ණය ව්‍යාපෘතිය. | 25 | 25 | 25 |
| ප්‍රසම්පාදන | ටෙන්ඩර් දැන්වීම් පලකිරිම. | 10 | 10 | 10 |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි පාඨමාලා ලැයිස්තු. | 45 | 45 | 45 |
| පාලන | පුරප්පාඩු පලකිරිම | 03 | 03 | 03 |

**03. උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නවීකරණය කර සකස් කිරීම.**

තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) දායකත්වය සහිතව, උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නව මුහුණුවරකින් සකස් කර අවසන් කර ඇත. මීට අමතරව රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල අංශයට අදාළ උපාධි හා උපාධි ලබාදෙන පෞද්ගලික විශ්වවිද්‍යාල ලියාපදිංචි කිරීම සඳහා ද මාර්ගගත තොරතුරු තාක්ෂණික පද්ධතිය ද සකස් කර ඇත. මේ වන විට උසස් අධ්‍යාපන අංශයේ නව වෙබ් අඩවිය නිර්මාණය කර අවසන් කර ඇති අතර එය 2019 නොවැම්බර් මස එළිදක්වන ලදි.

සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යක් වන විදේශ සිසුන් හට වීසා පත්‍ර දීර්ඝ කිරීම හා නිර්දේශ ලබා දීම සඳහා නව මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව පද්ධති විශ්ලේෂනය කරමින් පවතී. එමෙන්ම සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල Wi-Fi පහසුකම් තව දුරටත් පුළුල් කරමින් පවතින අතර රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල ලියාපදිංචි කිරීමේ මාර්ගගත පද්ධතියේ (Cross Government Document Management System) වැඩ අවසන් කර එය පරීක්ෂා කිරීමේ තත්වයේ පවතී. (මෙය ICTA සහය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි.)

මීට අමතරව 2016 අයවැය යෝජනාවට අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලවල Wi-Fi පහසුකම් තවදුරටත් පුළුල් කිරීම සඳහා පහත සඳහන් උසස් අධ්‍යාපන ආයතන 2019 වර්ෂයේ තෝරාගෙන ඇත.

- රුහුණු විශ්වවිද්‍යාලය, මාතර.
- ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද ආයතනය , ගම්පහ.
- නැගෙනහිර විශ්වවිද්‍යාලය - චෙන්කලයාඩි.
- යාපන විශ්වවිද්‍යාලය වවුනියා මණ්ඩපය.
- කිලිනොච්චි ඉංජිනේරු පීඨය, යාපනය විශ්ව විද්‍යාලය.
- හොරණ ශ්‍රීපාලි මණ්ඩපය.
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ත්‍රිකුණාමල මණ්ඩපය.

දෙවන අදියරේදී තෝරාගත් ඉහත ආයතනවලට Wi-Fi යටිතල පහසුකම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර එය ක්‍රියාත්මක කිරීමේ අවසාන තත්වයේ පවතී. රුපියල් මිලියන 151,568,789.18 මුදලක් රජයෙන් වියදම් කරනු ලබයි. මේ සඳහා සේවා සපයන ආයතනය ලෙස Pan Audio Private Ltd ආයතනය තෝරාගෙන ඇති අතර , මේ වන විට මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතී.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ලබා දී ඇති Free Wi-Fi පහසුකම් සපයන ලද විශ්වවිද්‍යාල.**

| දිස්ත්‍රික්කය | විශ්වවිද්‍යාලය / ආයතනය | Wi-Fi ස්ථාන |
|---|---|---|
| අම්පාර | ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය, ව්‍යවහාරික විද්‍යා පීඨය | 2 |
| අනුරාධපුරය | රජරට විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය - අනුරාධපුරය | 3 |
| මඩකලපුව | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - ව්‍යවහාරික විද්‍යා පීඨය | 1 |
| කොළඹ | කොළඹ වි.වි, බෞද්ධ හා පාලි වි.වි, මොරටුව වි. වි, සෞන්දර්ය වි.වි, විවෘත වි. වි | 6 |
| ගාල්ල | රුහුණු වි.වි - ඉංජිනේරු පීඨය , වෛද්‍ය පීඨය | 2 |
| ගම්පහ | කැළණිය වි.වි, විවෘත වි.වි - මිරිස්වත්ත | 2 |
| යාපනය | යාපනය විශ්වවිද්‍යාලය | 1 |
| කළුතර | ශ්‍රී පාලි මණ්ඩපය - හොරණ | 1 |
| නුවර | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2 |

**තොරතුරු තාක්ෂණ අංශය විසින් අමාත්‍යාංශය තුල සපයන ලද සේවාවන් පහත දැක්වේ.**

| සේවා සැපයුම් විස්තරය | වාර්තා කරන ලද හා නිරාකරණය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව ( 2019.01.01 සිට 2019.12.31 දක්වා ) |
|---|---|
| අන්තර්ජාලට පිවිසීමේදී ඇති ගැටළු | 90 |
| E-Mail පිළිබද ගැටළු | 50 |
| මෘදුකාංග යාවත්කාලීන කිරීම් | 30 |
| නව මෘදුකාංග ස්ථාපනය කිරීම් | 40 |
| සුළු දෘඩාංග ගැටළු | 90 |
| පරිගණක මුද්‍රණ ගැටළු | 90 |
| පරිගණක මුද්‍රණ යන්ත්‍ර වල ඇති වන දෝෂ | 30 |
| WI-FI පිළිබද ඇතිවන ගැටළු | 60 |
| ජාලකරණ ගැටළු | 50 |
| වෛරස් මගින් ඇති වන ගැටළු | 20 |
| Share Folder වල ඇති වන ගැටළු | 15 |
| N පරිගණක වලින් ඇති වන ගැටළු | 30 |
| වාහන බලපත්‍ර පද්ධතිය සම්බන්ධ ගැටළු | 45 |

**මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කරනු ලැබූ පරිගණක සංඛ්‍යාව ( 2019.01.01 සිට 2019.12.31)**


| අංශය | පරිගණක සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන අංශය | 3 |
| තොරතුරු තාක්ෂණ අංශය | 2 |
| අභ්‍යන්තර විගණනය අංශය | 2 |
| ගිණුම් අංශය | 4 |
| රජයේ විගණනය අංශය | 3 |
| ප්‍රසම්පාදන අංශය | 2 |
| පාලන අංශය | 4 |

**මෘදුකාංග භාවිතාකර තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරනු ලැබේ. මුදල් අමාත්‍යාංශයට යවන වාර්තා ස්වයංක්‍රීයව මෙම පද්ධතියෙන් ලබා ගනු ලැබේ. 2019.01.01 සිට 2019.12.31 වන දින දක්වා වාහන බලපත්‍ර නිකුතුව**

| **මාසය** | **වාහන බලපත්‍ර නිකුතුව** |
|---|---|
| ජනවාරි | 74 |
| පෙබරවාරි | 39 |
| මාර්තු | 59 |
| අප්‍රේල් | 06 |
| මැයි | 103 |
| ජුනි | 184 |
| ජුලි | 155 |
| අගෝස්තු | 91 |
| සැප්තැම්බර් | 97 |
| ඔක්තෝම්බර් | 95 |
| නොවැම්බර් | 128 |
| දෙසැම්බර් | 94 |
| **එකතුව** | **1,125** |

## 1.5.5. සංවර්ධන අංශය

**සංවිධාන සටහන**



**1.5.5.1. සංවර්ධන අංශයේ කාර්යභාරය**

- 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ නව පාඨමාලා ආරම්භ කිරීම, පාඨමාලා වෙනස්කිරීම, නව පීඨ හා අංශ ආරම්භ කිරීම ආදී නියමයන් හා නියමාවලි පළකිරීම
- රජයේ විශ්වවිද්‍යාල ස්ථාපනය හා පුලුල් කිරීම සඳහා ඉඩම් මිලදී ගැනීම හා අත්පත් කර ගැනීම පිළිබඳ සියලු කටයුතු
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාළ සියළුම කටයුතු (සේවක සංඛ්‍යා පිළිබඳ කරුණු හැර)
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උපාධි අධ්‍යාපන ආයතනයන්හි පාලක සභා/ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ සියලුම කටයුතු
- සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අයත් පශ්චාත් උපාධි ආයතන වෙතින් ලැබෙන විදේශ නිවාඩු ඉල්ලුම්පත් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා ගරු අමාත්‍යතුමාගේ අවසරය ලබා දීමට අදාළ කටයුතු
- විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩල එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශිය අරමුදල් ප්‍රයෝජනයට ගෙන විදේශ චාරිකා සඳහා සහභාගිවීමේ දි වැයවන ප්‍රතිපාදනවලට අවශ්‍ය අනුමැතිය අමාත්‍යාංශ ලේකම්ගෙන් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.
- විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 431 අනුව යානාපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමට අදාළ කටයුතු.
- විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු
- විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම
- උපාධි සහතික පිළිගැනීම හා සමාන කිරීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම/අදාළ ආයතනයන්ට ඉදිරිපත් කර පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම
- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ගුවන් මඟින් ආනයනය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 368 අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු
- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ආනයනය කිරිමේදී එවැනි භාණ්ඩ සඳහා තීරුබදු සහ වැට්බදු නිදහස් කිරීම/සහන සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් සඳහා 2012.11.08 දිනැති අංක 1783/18 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අනුමැතිය ලබා ගැනිම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- මහපොළ භාරකාර අරමුදලේ කටයුතු

**1.5.5.2. කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත් කිරීම**

2019.01.01 සිට 2019.12.31 දක්වා

| විශ්වවිද්‍යාලය | කුලපති | පත්වීම් දිනය | උප කුලපති | පත්වීම් දිනය |
|---|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | - | - | මහාචාර්යය චන්ද්‍රිකා එන්.විජේරත්න | 2019.04.12 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය අග්ගමහා පණ්ඩිත නාපාන පේමසිරි හිමි | 2019.06.01 | පූජ්‍ය මහාචාර්ය වරදිවෙල විජයසුමන ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2019.01.24 |
| සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | - | - | මහාචාර්යය සරත් චන්ද්‍රජීව (නිසිබලධරයා ලෙස වීරකෝන් මුදියාන්සේලාගේ අබේරත්න බණ්ඩාර මහතා) | 2019.12.13 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | - | - | මහාචාර්යය එල්වියන් වාල්මුස් රේගල් | 2019.01.22 |
| රජරට විශ්වවිද්‍යාලය | - | - | ආචාර්යය බී.ඒ.කරුණාරත්න | 2019.01.01 |
| රුහුණ විශ්වවිද්‍යාලය | පූජ්‍ය අකුරටියේ නන්ද හිමි | 2019.07.08 | ජ්‍යෙෂ්ඨ මහචාර්යය ටී.එස්.ඩී.අමරසේන | 2019.03.08 |
| වෘත්තීය තාක්ෂණ වි.වි | - | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් මහතා (නිසි බලධරයා) | 2019.12.18 |

### 1.5.5.3. විදේශ නිවාඩු

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා නිවාඩු අනුමැතිය ලබා දීම - (2019.01.01 සිට 2019.12.31 දක්වා)

| විශ්වවිද්‍යාලය/ආයතන | රාජකාරි නිවාඩු | පෞද්ගලික නිවාඩු | එකතුව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 28 | 12 | 40 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 29 | 16 | 45 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 71 | 40 | 111 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 760 | 349 | 1,109 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 511 | 236 | 747 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 353 | 179 | 532 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 370 | 203 | 573 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 184 | 196 | 380 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 244 | 121 | 486 |
| යාපනය විශ්වවිද්‍යාලය | 255 | 154 | 409 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 109 | 50 | 159 |
| විවෘත විශ්වවිද්‍යාලය | 104 | 75 | 179 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 123 | 73 | 196 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 77 | 74 | 151 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 95 | 88 | 183 |
| රජරට විශ්වවිද්‍යාලය | 73 | 13 | 86 |
| වයඹ විශ්වවිද්‍යාලය | 69 | 31 | 100 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 40 | 18 | 58 |
| වවුනියා මණ්ඩපය | 4 | 13 | 17 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (GWAI – Kelaniya)) | 2 | 11 | 13 |
| ස්වාමි විපුලානන්ද ආයතනය (Eastern) | 1 | 4 | 5 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය (PGIPBS -Kelaniya) | 18 | 4 | 22 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA - Kelaniya) | 11 | 2 | 13 |
| ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය (PGIE - Open) | 14 | 2 | 16 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය (PIM - Japura) | 108 | 3 | 111 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | 4 | 30 | 34 |
| **එකතුව** | **3,657** | **1,997** | **5,654** |

### 1.5.5. 4. දේශීය අරමුදල් හා උපයාගත් අරමුදල් අනුමැතිය

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශිය අරමුදල් (Domestic Funds) අයදුම්පත්‍ර සඳහා අනුමැතිය / නිර්දේශ ලබාදීම. (2019.01.01 සිට 2019.12.31 දක්වා)

| විශ්වවිද්‍යාලය | දේශිය හා උපයාගත් අරමුදල් අයදුම්පත්‍ර සංඛ්‍යාව | ගුවන් ටිකට් පත්‍ර අයදුම්පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 137 | 11 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 8 | 7 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 194 | 0 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 51 | 6 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 1 | 5 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 0 | 9 |
| විවෘත විශ්වවිද්‍යාලය | 18 | 36 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 7 | 3 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 13 | 0 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 35 | 0 |
| රජරට විශ්වවිද්‍යාලය | 20 | 0 |
| වයඹ විශ්වවිද්‍යාලය | 2 | 0 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 17 | 0 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 9 | 0 |
| පශ්චාත් උපාධි කළමනාකරණ | 59 | 0 |
| පශ්චාත් උපාධි ඉංග්‍රීසි ආයතනය | 4 | 0 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 5 | 0 |
| **එකතුව** | **580** | **77** |

**විදේශ අධ්‍යාපන ඒකකය**

**01. ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ ශිෂ්‍යත්ව අවස්ථාවන් ලබාදීම

විදේශීය රටවල උසස් අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දෙමින් වාර්ෂිකව සෘජු සහ වක්‍රව විදේශීය ප්‍රථම හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි. ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව ලබා දෙනු ලබන රටවල් වන්නේ බංගලාදේශය, ඉන්දියාව, චීනය, සර්බියාව, කියුබාව, රුසියාව, පකිස්ථානය, වියට්නාමය, ජපානය, චීනය වේ. පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ලබා දෙනු ලබන රටවල් වන්නේ ඉන්දියාව, චීනය, ජපානය, රුසියාව, නවසීලන්තය, එක්සත් රාජධානිය වේ.

**ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය:-**

අදාල ශිෂ්‍යත්ව පිළිබඳ තොරතුරු භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත් මඟින් හා අපගේ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මඟින් ප්‍රචාරය කර අයදුම්පත් කැඳවීම සිදුකර විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් යටතේ සිසුන් තෝරා ගැනීම සිදුකරයි.

එසේම උක්ත කරුණු වලට අමතරව අමාත්‍යාංශය සම්බන්ධ නොවී සෘජුව අයදුම් කල හැකි විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ශිෂ්‍යත්ව අවස්ථා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම ද සිදු කරනු ලබයි.

**පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2013 – 2019 දක්වා**

| රට | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|
| ඉන්දියාව | 37 | 31 | 20 | 27 | 31 | 34 | 41 |
| චීනය | 11 | 16 | 8 | 5 | 18 | 12 | 13 |
| ජපානය | 9 | 9 | 7 | 7 | 7 | 7 | 7 |
| රුසියාව | - | - | - | 3 | 2 | 6 | 3 |
| නවසීලන්තය | 1 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| එක්සත් රාජධානිය | 7 | 7 | 8 | 8 | 7 | 5 | ප්‍රතිඵල ලැබී නොමැත |
| **එකතුව** | **65** | **64** | **45** | **51** | **67** | **65** | **66** |

**ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2013 - 2019 දින දක්වා**

| රට | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|
| බංග්ලාදේශය | 5 | 7 | 9 | 6 | 12 | - | - |
| ඉන්දියාව | 115 | 133 | 152 | 139 | 116 | 105 | 109 |
| චීනය | 13 | 18 | 10 | 10 | ලැබී නැත | 10 | 10 |
| බෲනායි | - | - | 2 | - | ලැබී නැත | - | - |
| කොරියාව | 1 | 2 | - | - | - | - | - |
| කියුබාව | - | 2 | 2 | 1 | 1 | 1 | 1 |
| රුසියාව | 20 | 37 | 20 | 18 | 22 | 18 | 07 |
| පකිස්ථානය | 9 | 10 | 10 | 11 | 11 | 11 | 18 |
| සර්බියාව | 1 | 1 | 1 | 1 | - | - | 1 |
| මැසිඩෝනියාව | - | 1 | - | - | - | - | - |
| වියට්නාමය | 5 | 5 | 5 | - | 5 | 5 | 5 |
| ජපානය | 5 | 1 | 1 | 1 | 1 | 1 | ලැබී නැත |
| චීනය (Macao Foundation) | - | - | - | - | 1 | 2 | - |
| **එකතුව** | **174** | **217** | **212** | **187** | **169** | **153** | **151** |

## 02.විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීම සඳහා ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ ගුණාත්මක උසස් අධ්‍යාපන අවස්ථා පිළිබඳව විදෙස් රටවල ප්‍රචාරය වීමත් ඒ තුලින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදෙස් සිසුන් වැඩි වශයෙන් ආකර්ශනය කර ගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය සහිතව 2011 වසරේ සිට ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2011 වසරේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ. ඒ අනුව ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වන විට ශිෂ්‍යත්ව ලාභී මුළු සිසුන් සංඛ්‍යාව 148 කි. මේ වන විට පශ්චාද් උපාධි සාර්ථකව හදාරන ලද  පාකිස්තාන, නේපාල, භූතාන, නයිජීරියානු හා කොරියානු සිසුන් 47 දෙනෙකු තම රටවලට පිටත්ව ගොස් ඇත.

**2014/15 (2016 වර්ෂය සඳහා) අධ්‍යයන  වර්ෂය සඳහා ලියාපදිංචි සිසුන් ගණන**

| රට | **2014/2015 සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| ඉන්දුනීසියාව | 2 |
| පාකිස්ථානය | 5 |
| මාලදිවයින | 5 |
| නේපාලය | 6 |
| භූතානය | 4 |
| නයිජීරියාව | 2 |
| උගන්ඩාව | 1 |
| කෙන්යාව | 1 |
| **එකතුව** | **26** |

2014/15 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලත් සිසුන් 23 දෙදෙනෙකු මේ වන විට විශ්වවිද්‍යාල වල ඉගෙනුම ලබමින් සිටී.

**2014/2015 වර්ෂවල එක් එක් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු කරන සිසුන් සංඛ්‍යාව**

| විශ්වවිද්‍යාලය | **2014/2015** ප්‍රථම උපාධි සිසුන් | **2015/2016** ප්‍රථම උපාධි සිසුන් | **2016/2017** ප්‍රථම උපාධි සිසුන් |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 5 | 2 | 2 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 5 | - | - |
| රුහුණු විශ්වවිද්‍යාලය | 1 | - | - |
| කැළණිය විශ්වවිද්‍යාලය | 7 | - | 1 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2 | 5 | 2 |
| යාපනය විශ්වවිද්‍යාලය | 2 | 2 | - |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 1 | 1 | - |
| වයඹ විශ්වවිද්‍යාලය | - | 1 | - |
| රජරට විශ්වවිද්‍යාලය | | | 1 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | - | 1 | 1 |
| වවුනියා මණ්ඩපය | - | 1 | - |
| **එකතුව** | **23** | **13** | **07** |

## 03. ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලංකාව තුළ පශ්චාද් උපාධි අධ්‍යාපන අවස්ථා තවදුරටත් ලබාදීම සඳහා 2014 වර්ෂයේදී **"ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන"** පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2014 වර්ෂයේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය යන ආයතන වාර්ෂිකව පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

**ලියාපදිංචි මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව**

| අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2014 | 02 |
| 2015 | - |
| 2016 | 02 |
| 2017 | 03 |
| 2018 | 02 |
| **එකතුව** | **09** |

ඒ අනුව ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වනවිට ශිෂ්‍යත්වලාභී මුළු පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව 09කි. පශ්චාත් උපාධි සාර්ථකව හදාරන ලද සිසුන් තිදෙනෙකු මේ වනවිට තම රටවලට පිටත්ව ගොස් ඇති අතර තවත් සිසුන් දෙදෙනෙකු පාඨමාලා හැරගොස් ඇත. සිසුන් සිව්දෙනෙකු මේ වනවිට පාඨමාලා හදාරමින් සිටී.

2019 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාද් උපාධි අයදුම්පත් කැඳවීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ දැන්වීම ප්‍රසිද්ධ කිරීම සිදු කළ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය සඳහා අයදුම්පත් 34 ක් ද කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය සඳහා අයදුම්පත් 34 ක් ද ලැබී ඇත. ඒ අතුරින් සුදුසුකම්ලත් සිසුන් දෙදෙනෙකු තෝරා ගෙන ඇති අතර ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමේ කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතී.

## 04. දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු යනාදිය සඳහා නිලධාරීන් යොමු කිරීම

දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු යනාදියට ලැබෙන අවස්ථා සඳහා සුදුසු නිලධාරීන් නම් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම්තුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අදාල විශ්වවිද්‍යාල වෙත දන්වා යැවීම සහ ඒ අනුව ලැබෙන නාම යෝජනා අදාළ ආයතන වෙත දන්වා යැවීමට කටයුතු සිදු කිරීම

### 05. විදේශීය සිසුන් සඳහා වීසා (Visa) පහසුකම් ලබා දීම

අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශ සිසුන් සඳහා ඇතුළත්වීමේ වීසා (Entry Visa) සහ මෙරටට පැමිණීමෙන් පසුව අදාළ කාලසීමාවට අනුව නේවාසික වීසා (Residence Visa) ලබාදීම හා දීර්ඝ කිරීමට අදාළ නිර්දේශ අප අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත පැමිණෙන විදේශ සිසුන් පහත පරිදි වේ.

a) ශ්‍රී ලංකා ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පැමිණෙන සිසුන්
b) අවබෝධතා ගිවිසුම් වලට අනුව හුවමාරු වැඩසටහන් යටතේ පැමිණෙන සිසුන්
c) මෙරට විදේශ නියෝජිතායතන හරහා කෙටිකාලීන පුහුණුව සඳහා මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත පැමිණෙන සිසුන්
e) මුදල් ගෙවා ඩිප්ලෝමා/ උපාධි/ පශ්චාත් උපාධි හැදෑරීමට රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත පැමිණෙන සිසුන්

### 06. විදේශ ආචාර්යවරුන් සඳහා වීසා (Visa) පහසුකම් ලබා දීම

I. අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශ ආචාර්යවරුන් සඳහා ඇතුළත්වීමේ වීසා (Entry Visa) සහ මෙරටට පැමිණීමෙන් පසුව අදාළ කාලසීමාවට අනුව නේවාසික වීසා (Residence Visa) ලබාදීම හා දීර්ඝ කිරීමට අදාළ නිර්දේශ අප අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

II. ඒ අනුව, මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත පැමිණෙන විදේශ ආචාර්යවරුන් පහත පරිදි වේ.

b) අවබෝධතා ගිවිසුම් වලට අනුව හුවමාරු වැඩසටහන් යටතේ පැමිණෙන ආචාර්යවරුන්

c) සේවා අවශ්‍යතාව අනුව වැටුප් ගෙවීමේ පදනම මත හා ස්වේච්ඡා පදනම මත පැමිණෙන ආචාර්යවරුන්

### 07. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීම

- අවබෝධතා ගිවිසුම් සඳහා එළඹීම
  උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීමේ අරමුණින් අමාත්‍යාංශය රාජ්‍ය විශ්වවිද්‍යාල, විදේශ විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන සමඟ මෙන්ම විශ්වවිද්‍යාල පර්යේෂණ සඳහා ද නිරන්තර ගිවිසුම් ඇති කර ගනු ලබයි.ඒ අනුව,
- විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, සිසුන්, අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා හුවමාරු වැඩසටහන්
- විදේශීය භාෂා ඉගෙනීමේදී භාවිතා කරන අධ්‍යාපනික උපකරණ, විශේෂයෙන්ම ශ්‍රව්‍යය සහ දෘශ්‍යය උපකරණ හුවමාරු කිරීම
- පර්යේෂණ සහයෝගිතා අවස්ථා, සාහිත්‍යය, පර්යේෂණ සොයා ගැනීම් සහ වෙනත් අදාළ ප්‍රකාශන පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම
- අධ්‍යාපන සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු පාඨමාලා සහ ප්‍රදර්ශනවල සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම

යනාදී වැඩසටහන් මඟින් එකී සහයෝගීතාවය ලබා දෙනු ලබන අතර මෙම සහයෝගීතා වැඩසටහන් නිශ්චිත වූ අධ්‍යයන කාලසීමාවක් සඳහා ලබා දෙනු ලබයි.

**08. ශ්‍රී ලංකාව හා වෙනත් රාජ්‍යයන් අතර ද්විපාර්ශවිකව සාකච්ජා (Bilateral Discussions)**

a. උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ සාකච්ජා සඳහා විදේශ රටවලින් මෙරටට පැමිණෙන දූත මණ්ඩල සමඟ පැවැත්වෙන සාකච්ජා සංවිධානය කිරීමට අදාළ කටයුතු.

b. විදේශීය රටවල් මඟින් ශ්‍රී ලංකාව තුල සිදු කරන උසස් අධ්‍යාපන ප්‍රවර්ධන වැඩසටහන් (ex: India , China) සම්බන්ධීකරණය.

c. උසස් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශීය රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාල මඟින් කරන විමසීම් සම්බන්ධව කටයුතු කිරීම හා ඒවායේ නියෝජිත පිරිස් සමඟ සාකච්ජා කිරීම.

**අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය**


එක්සත් ජාතීන්ගේ සංවිධානය, සාර්ක් සංවිධානය, යුනෙස්කෝ සංවිධානය, කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට/විශ්වවිද්‍යාලවලට අදාල කාර්යයන් සම්බන්ධීකරණය.

**විදේශ දූත සංචාර සඳහා තොරතුරු සැපයීම**

මෙරටදී හා විදේශයන්හිදී රාජතාන්ත්‍රික සාකච්ජා සඳහා සහභාගීවන දූත මණ්ඩල සාමාජිකයින් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාලව අවශ්‍ය වන තොරතුරු හා දත්ත සපයා දීම.

## 1.5.6. සැලසුම් අංශය

**සංවිධාන සටහන**



## 1.5.6.1 සැලසුම් අංශයේ කාර්යභාරය

**01. දේශීය හා විදේශීය ව්‍යාපෘති නියාමනය කිරීම.**

- දේශීය හා විදේශීය ව්‍යාපෘති යෝජනා අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම, හා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තුමේන්තුව විසින් එම ව්‍යාපෘතිවලට අදාලව කරනු ලබන විමසීම් සඳහා පිළිතුරු සැපයීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද දේශීය ව්‍යාපෘති පිළිබඳව අදාල ආයතන දැනුවත් කිරීම හා ඒවා ආරම්භ කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලබන විදේශීය ව්‍යාපෘති වලට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අනුමත කරන ලද විදේශ ව්‍යාපෘති වලට අදාලව ව්‍යාපෘති කළමනාකරන අංශයන් පිහිටුවීමට අදාල කටයුතු සිදු කිරීම.
- විදේශ ව්‍යාපාති වලට අදාලව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- විදේශ ව්‍යාපෘති වලට අදාලව අත්සන් කල යුතු MOU අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.
- විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කාර්යයන් ඉටුකිරීම හා ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, මෙහෙයුම් කමිටු සමාජිකයින් පත්කිරීම, මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම හා එම රැස්වීම්වල ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- විදේශීය අරමුදල් ව්‍යාපෘති වල නියාමනය කිරීමට වරින්වර පැමිණෙන විදේශ දූත පිරිස් සමඟ පැවැත්විය යුතු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘතිවල හා විදේශීය ව්‍යාපෘතිවල කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති දත්ත විශ්ලේශණය කිරීම, ගැටළු හඳුනා ගැනීම සහ පසු විපරම් කිරීම.
- අමාත්‍යාංශය සෘජු පාලනය යටතේ පවතින විදේශ ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී ඉදිරි වර්ෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසාදීම .
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා එවන ලද ව්‍යාපෘතීයන් හී සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දේශීය හා විදේශීය ව්‍යාපෘතිවලට අදාලව ජනාධිපති ලේකම් කාර්යාලය, ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ආකෘති අනුව කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කර ලබාදීම.

**02. අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

- වාර්ෂික අයවැය වාර්තාව සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම හා එම ව්‍යාපෘති යෝජනා වලින් සුදුසු ව්‍යාපෘති අයවැය යෝජනා ලෙස සලකා බැලීමට මුදල් අමාත්‍යාංශය වෙත යැවීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා අයවැය යෝජනා ව්‍යාපෘති වලට හා විදේශීය ව්‍යාපෘති වලට අදාල අයවැය අවශ්‍යතාවයන් ලබා ගැනීම හා ඒවා විමර්ෂනය කර බලා අයවැය අවශ්‍යතා නිසිපරිදි සකස් කර ගිණුම් අංශයට ලබා දීම.
- මුදල් අමාත්‍යාංශය සහ අනිකුත් ආයතන අතර අයවැය සාකච්ඡා පැවැත්වීම සංවිධානය කිරීම.
- වාර්ෂික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තුමේන්තුවවෙත යැවීම හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිලියෙල කිරීම.
- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් සමඟ එක්ව අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- වාර්ෂික අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ගිණුම් අංශය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ප්‍රගති වාර්තා සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- අයවැය යෝජනා ව්‍යාපෘතිවලට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ආකෘති අනුව කාර්තුමය ප්‍රගති වාර්තා පිලියෙල කර ලබාදීම.

**03. අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව හා වාර්ෂික කාර්යයසාධන වාර්තාව පිළියෙල කිරීම**

උසස් අධ්‍යාපන අංශය විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රගති සමාලෝචන වාර්තාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.

**04. ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සැකසීම හා අධීක්ෂණය**

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා උපාය මාර්ගීක සැලැස්ම ජාතික ආර්ථික ප්‍රතිපත්ති රාමුවේ වෙනස්වීම් වලට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන වල ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.
- පවරන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී අමාත්‍යාංශය නියෝජනය කරමින් දායකත්වය ලබාදීම.

**05. විවිධ ආයතන විසින් වරින්වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම**

- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්ෂිකව ලබා දිය යුතු වාර්තා සකස් කිරීම.
- ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු තොරතුරු කලානුරූපීව ලබා දීම.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සකස් කිරීමට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල දත්ත ලබා දීම.
- රජයේ විවිධ ආයතන විසින් හා අමාත්‍යාංශ මඟින් වරින්වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම.

**06. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා පවත්වාගෙන යාම**

- ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම හා දත්ත පද්ධති පවත්වාගෙන යාම විශ්ලේෂණය කිරීම.
- අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම සහ වාර්තා පිළියෙල කිරීම
- විශ්වවිද්‍යාල හා අනුබද්ධ ආයතන වලට වාර්ෂිකව අවශ්‍ය තොරතුරු තාක්ෂණික පද්ධති, මෙවලම් හා Wi-Fi පහසුකම් වලට අදාළ තොරතුරු වාර්ෂිකව යාවත්කාලීන කිරීම හා දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.

**07. අනෙකුත් කාර්යයන්**

- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව පර්යේෂණ යෝජනා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, එහිදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති වර්තා පිළියෙල කිරීම.
- මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අවශ්‍ය දත්ත ලබා දිම
- දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා දීම.
- Economic Policy Statement වලට අදාළ ප්‍රගති වාර්තා සකස් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු සඳහා වන සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.
- ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සහ සේවා ප්‍රතිපත්ති සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.
- යුනෙස්කෝ අධාර යටතේවිශ්ව විද්‍යාල පද්ධතිය තුල ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහය ලබාදීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා යුනෙස්කෝ ආයතනය මඟින් කරනු ලබන විමසීම් වලට පිලිතුරු සැපයිම හා ප්‍රගති වාර්තා ලබාදීම.
- යුනෙස්කෝ ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම
- මෙරටදී හා විදේශයන්හිදී රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා සඳහා සහභාගී වන දූත මණ්ඩල සාමාජිකයන් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල තොරතුරු සැපයීම.

**1.5.6. 2 සැලසුම් අංශය 2019.01.01 සිට 2019.12.31 දක්වා කරන ලද කාර්යයන්.**

- දේශිය විදේශිය ව්‍යාපෘති වලට අදාලව 2019 වර්ෂයේ කාර්තු තුනක් සඳහා ප්‍රගති වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයටත් 2019 වසරේ කාර්තු හතර සඳහා වූ ප්‍රගති වාර්තාව ව්‍යාපෘති මෙහෙයුම් හා කළමනාකරණ දෙපාර්තමේන්තුවටත් ලබාදීම.

- 2019 වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

| ව්‍යාපෘතිය/ආයතනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන |
|---|---|
| අයවැය යෝජනා ව්‍යාපෘති | 23 |
| විදේශ ව්‍යාපෘති | 13 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 02 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 02 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 02 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 01 |
| රජරට විශ්වවිද්‍යාලය | 01 |
| **එකතුව** | **44** |

- 2019 වර්ෂයේදී විදේශ ව්‍යාපෘතිවලට අදාලව පහත පරිදි මෙහෙයුම් කමිටු සාමාජිකයන් පත්කර ඇත.

| **ව්‍යාපෘතියේ නම** | **සාමාජිකයන්** |
|---|---|
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 02 |


- මීට අමතරව දැනට ක්‍රියාත්මක වන ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය ලෝක බැංකු ව්‍යාපාතියට හා වයඹ සංවර්ධන ව්‍යාපෘතියට අදාල මෙහෙයුම් කමිටු තුන සඳහා පැවති පුරප්පාඩු පත් කිරිමට අදාල කටයුතු සිදු කරන ලදී.
- 2019 වර්ෂයේදී විදේශීය ව්‍යාපෘතිවලට අදාල මෙහෙයුම් කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

| **ව්‍යාපෘතිය** | **රැස්වීම් සංඛ්‍යාව** |
|---|---|
| කැලණිය, සබරගමුව, රජරට හා කොළඹ විශ්වවිද්‍යාල සඳහා විද්‍යා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය (ADB) | 06 |
| කිලිනොච්චිය- යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨය සඳහා පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම | 04 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 03 |
| උසස් අධ්‍යාපන සහ පර්යේෂණ සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (World Bank) | 02 |
| වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය | 03 |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 02 |
| **එකතුව** | **20** |

- 2017 වර්ෂයේ අනුමත කරන ලද 2019 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදුන් අයවැය යෝජනා 07ක් ද, 2018 වර්ෂයේ අනුමත වූ 2019 වර්ෂයේ දී ද ප්‍රතිපාදන ලබා දුන් අයවැය යෝජනා 5ක් සහ 2019 වර්ෂයේ අනුමත වූ ව්‍යාපෘති 01ක් ද ක්‍රියාත්මක කරන ලදී.
- 2019 වර්ෂයේ විදේශීය ව්‍යාපෘති 22ක් සැලසුම් අංශය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදී.
- අයවැය යෝජනා වලට අදාලව මාසික ප්‍රගති වාර්තා ජාතික අයවැය දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.
- 2018 වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ප්‍රගති සමාලෝචන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ලබා දී ඇත.
- මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්මේ මාසික ප්‍රගති වාර්තාව සකස්කර විදේශ රැකියා අමාත්‍යාංශයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීම් සුභසාධන හා කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම පුනරුත්තාපන උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදීම.
- විගණන විමසීම් 17ක් සඳහා පිලිතුරු සපයා ඇත.

## 1.5.7. අභ්‍යන්තර විගණන අංශය

**සංවිධාන සටහන**




### 1.5.7. I අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය භාරය: -

**1. විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම:-**

විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය අමාත්‍යාංශ ලේකම් විසින් දරන අතර , අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කාර්තුවකට වරක් මෙම කමිටු රැස්වීම් පවත්වනු ලබයි. මෙම කාලය තුලදී 2019.01.08 , 2019.06.03 හා 2019.12.19 යන දිනයන්හිදී මෙම කමිටු රැස්වීම් පවත්වනු ලැබිණි. එම කමිටු රැස්වීම්වලදී,

i. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වත්කම් ලේඛණවල ඇතුලත් කර ඇති ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම, මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී ඇති වී ඇති ගැටළු සහගත තත්වයන්, වාර්ෂික වාර්තා ඉදිරිපත්කිරීම් හා භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම ආදිය සාකච්ඡාවට භාජනය වූ අතර ඒවාට අවශ්‍ය කරනු ලබන විසඳුම් හා යෝජනා එහිදී ගනු ලැබුණි.

ii. විගණකාධිපති වාර්තා මගින් පැන නැගී ඇති කරුණු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.

iii. අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම.

iv. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ව්‍යාපෘතිවල වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය පිළිබදව සමාලෝචනය කිරීම.

v. ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම

vi. විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන විසින් විගණන හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය විමර්ෂණය කිරීම.

vii. ගිණුම් කාරක සභාවේදි සාකච්ඡාවට බදුන් වූ කරුණු පිලිබඳ සාකච්ඡා කිරීම හා ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කිරීම.

viii. 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කිරීමට අවධානය යොමු කිරීම

ix. රජයේ පිරිවැය අවම කිරීම සඳහා රජයේ නිලධාරින් විසින් කටයුතු සිදු කල යුතු බව

x. රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා පිලිතුරු ලබාදීම

## 2. මූල්‍ය කළමණාකරනය

මේ යටතේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය, එහි ශක්තිමත්භාවය පරීක්ෂා කිරීම, අත්තිකාරම් B ගිණුම පරීක්ෂාව හා මාසික ගිණුම් පරීක්ෂාවන් සිදු කිරීම , වවුචර් පරීක්ෂාවන් , බැංකු සැසඳුම් ප්‍රකාශයන් පරීක්ෂාව යන කාර්යයන් සිදු කරන ලද අතර ගැටළු සහගත තත්වයන් මතු වූ අවස්ථාවලදී ඒවා පෙන්වා දී අවශ්‍ය විසඳුම් නිර්දේශ කෙරිනි.

## 3. වත්කම් කළමණාකරනය

වත්කම් පාලනය සඳහා යොදා ඇති පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව පරීක්ෂාව , වත්කම් ලේඛණවල නිවැරදිතාවය පරීක්ෂාව , භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාවන් හා භාණ්ඩ සමීක්ෂණයේදී දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම යනාදිය සිදු කරන ලදී.

## 4. ප්‍රවාහන කළමණාකරනය

වාහන නඩත්තු ලේඛණ පවත්වාගෙන යාමේ නිවැරදිතාවය පරීක්ෂාව , ඉන්ධන පරිභෝජනය පිලිබඳ පරීක්ෂාව හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායීත්වය යන පරීක්ෂාවන් සිදු කිරීම.

## 5. ප්‍රසම්පාදන කළමණාකරනය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු වී ඇතිදැයි පරීක්ෂාව, ප්‍රසම්පාදන කටයුතුවල විනිවිදභාවයන් පරීක්ෂාව හා ඒ සම්බන්ධයෙන් හුවමාරු වන ලිපි ලේඛණයන් පරීක්ෂාව

**2019.01.01 සිට 2019.12.31 කාලය තුලදී අභ්‍යන්තර විගණන අංශය මගින් අනෙකුත් ආයතන සම්බන්ධයෙන් ඉටු කරන ලද කාර්ය භාරය:-**

## 1. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ව්‍යවස්ථානුකූලව හා අනෙකුත් අදාල වාර්තාවන්ට අනුව කටයුතු සිදුවන්නේදැයි සොයා බැලීම, අභ්‍යන්තර විගණන කටයුතු පිලිබඳව අධීක්ෂණය හා මග පෙන්වීම , විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම, විශේෂ විමර්ෂණයන් සිදු කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු දීම සම්බන්ධයෙන් සොයා බැලීම සිදු කරන ලදී.

## 2. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

රජයේ ප්‍රතිපත්ති හා නීති රීතිවලට අනුව කටයුතු සිදුවන්නේදැයි සොයා බැලීම, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන කටයුතු පිලිබඳව අධීක්ෂණය හා මග පෙන්වීම, විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම, විශේෂ විමර්ෂණයන් සිදු කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු දීම සම්බන්ධයෙන් සොයා බැලීම.

### 3. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

ව්‍යවස්ථානුකූලව හා අනෙකුත් අදාල වාර්තාවන්ට අනුව කටයුතු සිදුවන්නේදැයි සොයා බැලීම, අභ්‍යන්තර විගණන කටයුතු පිලිබදව අධීක්ෂණය හා මග පෙන්වීම, විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම, විශේෂ විමර්ෂණයන් සිදු කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු දීම සම්බන්ධයෙන් සොයා බැලීම.

### 4. ප්‍රාග්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඇගයීම, ගිණුම්කරණයන්හි නිවරදිතාවය පරීක්ෂා කිරීම, මූල්‍ය වාර්තා හා අනෙකුත් වාර්තාවන්හි නිවරදිතාවය හා ඒවා නියමිත වේලාවට සකස් කරන්නේ දැයි පරීක්ෂාව, රජයේ ප්‍රතිපත්ති හා නීති රීතිවලට අනුව කටයුතු සිදුවන්නේ දැයි සොයා බැලීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශනය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුවන්නේ දැයි පරීක්ෂා කිරීම හා ව්‍යාපෘතීන්හි අභ්‍යන්තර විගණන අංශය විසින් පෙන්වා දෙනු ලැබූ ගැටළු සහගත තත්වයන් සඳහා පියවරයන් ගැනීමට උපදෙස් ලබාදීම.

### 5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ඒ යටතේ ඇති විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන

ඉහත ආයතනයන්හි අභ්‍යන්තර විගණනයේ ඵලදායීත්වය ඇගයීම, මූල්‍ය වාර්තා හා අනෙකුත් වාර්තාවන්හි නිවරදිතාවය හා ඒවා නියමිත වේලාවට සකස් කරන්නේ දැයි පරීක්ෂාව, විශේෂ විමර්ෂණ සිදු කිරීම, විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම, විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ ක්‍රියාවලිය පරීක්ෂාවන් යනාදිය සිදු කරන ලදී.

### 6. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

අභ්‍යන්තර විගණන කටයුතු පිලිබදව අධීක්ෂණය හා මග පෙන්වීම , විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම, විශේෂ විමර්ෂණයන් සිදු කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු දීම සම්බන්ධයෙන් සොයා බැලීම.


### 7. විශේෂ විමර්ෂණ

ඉහත කටයුතුවලට අමතරව හදුනා ගත් ගැටළු සහගත සිද්ධීන් සම්බන්ධයෙන් විශේෂ විමර්ෂණයන් සිදු කොට විගණන විමසුම් ඉදිරිපත් කිරීම හා තෝරාගනු ලැබූ විශ්වවිද්‍යාල කිහිපයක බැංකු සැසදුම් පරීක්ෂාව අත්තිකාරම් පරීක්ෂාව, ගිණුම් පරීක්ෂාව හා පෙත්සම් විභාග කිරීම් යනාදිය සිදු කරනු ලැබිනි.

එමෙන්ම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරනු ලදුව, ලේකම් විසින් විමර්ෂණයන් සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කල පෙත්සම් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම හා ඒ සම්බන්ධයෙන් වන වාර්තා ලබා දීම.

## 1.5.8 . රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

**සංවිධාන සටහන**




උසස් අධ්‍යාපනය පිළිබඳ පවතින ධනාත්මක ආකල්ප දිනෙන් දින වර්ධනය වන පසුබිමක් තුල සිසුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වාර්ෂිකව ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය තුල පවතින අවස්ථා ඉහල නැංවීම අපහසු කරුණක්ව පවතී. එබැවින් ඒ සඳහා විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුලින් අධ්‍යයන අවස්ථා සැපයීමේ සාපේක්ෂ වැදගත්කම සලකා එම ක්ෂේත්‍රය වර්ධනය කිරීමත් නියාමනය කිරීමත් සෘජුවම මෙම අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර, ඒ සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය 2013 ජනවාරි මස ස්ථාපිත කරන ලදී.

තවද ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 25 ඒ වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව වූ උපාධි ප්‍රදානය කිරීමේ අවසරය ඉල්ලා සිටින රජ්‍ය නොවන ආයතන සඳහා අවසරය දීම කටයුතු සඳහා නිශ්චිත බලධරයා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කර එම කටයුතුද දැනට මෙම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ක්‍රියාත්මක කරමින් පවතී.

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ කාර්යභාරය**

I. නිශ්චිත බලධරයාගේ කාර්යභාරය ඉටුකිරීම.

a) රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නියාමනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති නීතිමය රාමුව හා රීතීන් සැකසීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

b) ප්‍රතීතනය හා තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම් සංවිධානය කිරීම, පැවැත්වීම හා ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.

c) උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ඉල්ලා ආයතන විසින් එවා ඇති අයදුම්පත්වල සුදුසුකම් සනාථ කර ගැනීම.

d) උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ඉල්ලා එවා ඇති අයදුම්පත් ඉදිරිපත් කරන ලද ආයතනවල සමාලෝචන කටයුතු සඳහා සමාලෝචන කමිටු පත් කිරීම, සමාලෝචනය කිරීම හා ඇගයීම් සිදුකිරීම හා සුදුසුකම් සපුරාලන ආයතන සඳහා උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ලබා දීම.

e) උපාධි පිරිනැමීමට අනුමැතිය ලැබූ ආයතනවල විස්තර හා ඒවායේ කටයුතු පිළිබඳව තොරතුරු පවත්වා ගෙනයාම හා පසු විපරම් කටයුතු හා යාවත්කාලීන කිරීම හා වාර්තාකරණය.

f) උපාධි ප්‍රදාන අනුමැතිය ලද, වසර 05 ක් සපුරා ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නැවත ඇගයීම් සිදුකිරීම හා පනතේ සඳහන් උපාධි ප්‍රදාන ආයතන පිළිපැදිය යුතු වෙනත් අවශ්‍යතා එම ආයතන විසින් ඉටු කර ඇති බවට සහතික වීම.

II. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

III. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අවස්ථා පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. විදේශ උසස් අධ්‍යාපන ආයතන මඟින් සහතික පිරිනමනු ලැබීම පිණිස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය යටතේ ලියාපදිංචි නොවූ දේශීය උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යන පාඨමාලා සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

V. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදාන අනුමැතිය ලබා දෙන ලද රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විදේශ සිසුන්ගේ වීසා අයදුම්පත් නිර්දේශ කිරීම සම්බන්ධ කටයුතු ඉටු කිරීම හා නව ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

VI. කාලානුරූපීව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධව පවතින ප්‍රතිපත්ති, නීතිරීති, රෙගුලාසි යාවත්කාලීන කිරීම.

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2019-01-01 දින සිට 2019-12-31දින දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා සිදු කරමින් පැවතුන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරයක් පහත දැක්වේ

### 01. තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

දැනට උපාධි ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වලට මෙන්ම විවිධ උසස් අධ්‍යාපන පාඨමාලා පවත්වාගෙන යනු ලබන අනෙකුත් සියළු උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීමේ කාලීන අවශ්‍යතාවය මත තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සකස් කරන ලද අදාල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය 2019/04/02 වන දින ලැබී ඇත. අනතුරුව 2019/06/17 දින නිකුත් කරන ලද එම පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයක භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පෙර එම කෙටුම්පත පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ යෝජනා හා නිරීක්ෂණ සඳහා යොමු කර ඇත. ලැබී ඇති අදහස් හා යෝජනා පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව - උසස් අධ්‍යාපනය පිළිබඳ අනු කාරක සභාවේ අවධානය සඳහා යොමු කර ඇත.

### 02. ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන හා නියෝග යටතේ ඇමතිවරයා විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් "නිශ්චිත බලධරයා" වශයෙන් පත්කර ඇත. ඒ අනුව නිශ්චිත බලධරයා විසින් උපාධි හා උපාධි ප්‍රදානය කිරීමේ ආයතන නිර්දේශ කිරීම පිණිස පිහිටවූ "ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව" 2019/01/01 දින සිට 2019/12/31දින දක්වා දක්වා රැස්වීම් වාර 10 ක් පවත්වා ඇත. එම රැස්වීම් වාරයන්හි ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම මෙම අංශය විසින් සිදු කරමින් පවතී.

### 03. 2019 වර්ෂය තුල උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාදුන් ආයතන හා නව අයදුම්පත්

2019 දෙසැම්බර් 31 දිනට මේ වන තෙක් ආයතන 18 ක් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇත. ඊ සොෆ්ට් මෙට්‍රො කැම්පස් ආයතනය 2019 වර්ෂය තුලදී උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගත් නව ආයතනය වේ. තවද මේ කාලය තුල උපාධි පාඨමාලා 146 ක් සඳහා උපාධි ප්‍රදානය කිරීමේ බලය පිරිනමා ඇත. එම උපාධි පාඨමාලා 146න් පිළිගත් ආයතන 09ක පාඨමාලා 24ක් සඳහා 2019 වර්ෂය තුලදී උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබා දී ඇත.

උපාධි පාඨමාලා ගණන (2019.12.31 දිනට)

| කාලය | ප්‍රථම උපාධිය | පශ්චාත් ඩිප්ලෝමා | ශාස්ත්‍රපති/ විද්‍යාපති | දර්ශනශූරි | දර්ශනපති/ ආචාර්ය | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 2018.01.01සිට 2018.12.31 තෙක් | 82 | 12 | 10 | 10 | 08 | **122** |
| 2019.01.01සිට 2019.12.31තෙක් | 20 | - | 03 | - | 01 | **24** |
| **මුළු ගණන** | **102** | **12** | **13** | **10** | **09** | **146** |

### 04. නව අයදුම්පත් සඳහා සමාලෝචනයන්

දැනටමත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතන 18ට අමතරව නව ආයතන 13කින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සහ උපාධි ප්‍රදානය කිරීමේ බලය සඳහා අයදුම් කර ඇත. දැනට සිදු කරමින් පවතින ආයතනික සමාලෝචන පහත පරිදි වේ.

නව අයදුම්කාර ආයතනවල සමාලෝචනයන් පිළිබඳ විස්තර

| | |
|---|---|
| (1) නලීමියා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉස්ලැමික් ස්ටඩීස් සොසයිටි (ඉන්කෝපරේෂන්) | ආයතනික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. විෂය සමාලෝචනය සිදුකෙරෙමින් පවතී. |
| (2) ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් | |
| (3) ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් | |
| (4) රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කොලම්බු ප්‍රයිවට් ලිමිටඩ් | ආයතනික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. විෂය සමාලෝචනය ආරම්භ කර ඇත. |
| (5) බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (6) ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ආයතනික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. |

| | |
|---|---|
| (7) ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිටියුට් ප්‍රයිවට් ලිමිටඩ් | ආයතනික සමාලෝචනය සිදුකෙරෙමින් පවතී. |
| (8) කොලොම්බු ස්කූල් ඔෆ් කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | |
| (9) බෙනඩික්ට් XVI කැතොලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (10) සසෙකස් එඩියුකේෂනල් සර්විසස් ලිමිටඩ් | |
| (11) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්ස්ටයිල්ස් ඇන්ඩ් ඇපරල් | |
| (12) රෆල්ස් කොලේජ් ඔෆ් ඩිසයින් ඇන්ඩ් බිස්නස් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (13) ඕස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සඳහා සුදුසුකම් නොලත් ආයතනයක් ලෙස නිර්දේශ කර ඇත. |

<u>සටහන-</u> 2019-01-01 දින සිට 2019-12-31දින දක්වා කාලය තුල උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සඳහා සුදුසුකම් නොලත් ආයතනයන් පහත සඳහන් පරිදි වේ.

1. බැටිකොලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්
2. බ්‍රිටිෂ් කොලේජ් ඔෆ් ඇප්ලයිඩ් ස්ටඩීස් ප්‍රයිවට් ලිමිටඩ්

එසේම 2019-01-01 දින සිට 2019-12-31දින දක්වා කාලය තුල පහත සඳහන් ආයතනයන් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සඳහා යොමු කළ අයදුම්පත් ඉල්ලා අස්කර ගන්නා ලදී .

1. එඩියුලින්ක් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්
2. ඉන්ෆොමැටික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ්

දැනටමත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතන අතුරින් ආයතන 12ක් තවත් නව උපාධි පාඨමාලා සඳහා උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාගැනීම සඳහා අයදුම් කර ඇත. ඒ අනුව, ආසන්න වශයෙන් නව උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් 76 කට ආසන්න ප්‍රමාණයක් විෂය සමාලෝචන ක්‍රියාවලියෙහි පවතී.

1) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)
2) ඇක්වයිනාස් උසස් අධ්‍යාපන විද්‍යාලය (Aquinas)
3) ජාතික ව්‍යාපාරික කළමනාකාරීත්ව විද්‍යාලය (NSBM)
4) කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය (CINEC)
5) හොරයිසන් කොලේජ් ඕෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි පුද්ගලික සමාගම (Horizon Campus)
6) KAATSU - උසස් වෛද්‍ය තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය
7) නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8) ශ්‍රී ලංකා ටෙක්නොලොජිකල් කැම්පස් (SLTC)
9) ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ විද්‍යා පීඨය (SIBA)
10) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් (SLINTEC)

11) සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Saegis Campus)
12) ඊ සොෆ්ට් මෙට්‍රෝ කැම්පස්

තවද ද ඉන්ස්ටිටියුට් ඔෆ් චාටඩ් එකවුන්ටන්ට්ස් ඔෆ් ශ්‍රී ලංකා ආයතනයේ උපාධි ප්‍රදානය කිරීමේ බලතල පිළිගත් පාඨමාලාවෙහි විෂය නිර්දේශය වෙනස් කිරීම සඳහා අමාත්‍යාංශයේ අවසරය ඉල්ලා ඇත. එය සමාලෝචනය සඳහා විෂය පිළිබඳ විද්වත් කමිටුවක් පත් කර ඇත.

**05. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම.**

උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් එම ආයතන වල පාඨමාලාවන් ශිෂ්‍යයින් පිළිබඳ විස්තර ඇතුලත් කර මෙම අංශය මඟින් තොරතුරු පවත්වාගෙන යාම හා පසු විපරම් කටයුතු හා එහි යාවත්කාලීන කිරීම 2019 වර්ෂයේදී ද සිදු කර ඇත.

**06. උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස පිළිගෙන වර්ෂ 05 සම්පූර්ණ කරන ලද ආයතන හා උපාධි ප්‍රදාන බලය ලබාගත් උපාධි පාඨමාලා නැවත ඇගයීම**

උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස පිළිගෙන වසර 05 සම්පූර්ණ කරන ලද ආයතන හා උපාධි ප්‍රදාන බලය ලබාගත් උපාධි පාඨමාලා නැවත ඇගයීම අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව හඳුනාගත් ආයතන 06 ක් සඳහා ස්වයං ඇගයීමේ අයදුම්පතක් නිශ්චිත බලධරයාගේ රීති, රීති 2013 අංක 01 යටතේ ඇති මාර්ගෝපදේශයට අනුව සකස් කර එවා ඇත. එම අයදුම්පත් නැවත ඇගයීම සිදු කරමින් පවතී.

**07. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ (SLQF) 05 සහ 06 ස්ථරයන්ට අයත් උපාධි පාඨමාලා සඳහා හේයම් පාඨමාලා (BRIDGING COURSE) හඳුන්වා දීම.**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හඳුනාගත් පරිදි ඇතැම් උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කිරීම සඳහා වන අවම සුදුසුකම යම් විශේෂිත විෂය ධාරාවකට පමණක් සීමා වී ඇත. (උදා- පරිගණකකරණය (Computing) විෂය ධාරාවට අයත් උපාධි පාඨමාලා සඳහා වන අවම සුදුසුකම ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍ර ලේඛ අංක 995 දක්වා ඇත්තේ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව හදාරා ඇති සිසුන් සඳහා පමණි. ) නමුත් යම් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා වන අවම සුදුසුකම සපුරාගත හැකි නම් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවක් හදාරා ඇති සිසුන්හට ඒ සඳහා අවස්ථාවක් ලබා දීම සුදුසු බව අමාත්‍යාංශය විසින් හඳුනා ගෙන ඇත. එබැවින් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ (SLQF) 05 සහ 06 ස්ථරයන් සඳහා හේයම් පාඨමාලා හඳුන්වා දීමේ ක්‍රමවේදයක් සඳහා කමිටු පිහිටුවන ලදී. දැනට පරිගණකකරණය (Computing) විෂය ධාරාවට අයත් උපාධි පාඨමාලා, වාණිජ විෂය ධාරාවට අයත් උපාධි පාඨමාලා සහ ජීව විද්‍යා විෂය ධාරාවට අයත් උපාධි පාඨමාලා සඳහා වන කමිටු තුනක් පත් කරන ලදී. ඒ අනුව අදාළ හේයම් පාඨමාලා සඳහා විෂය නිර්දේෂයන් සකස් කර ඇති අතර එම පාඨමාලා පවත්වන ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත දන්වා යවා ඇත.

**08. ඩිජිටල් ලේඛන කළමනාකරණය සහ අභ්‍යන්තර වැඩ පද්ධතිය පරිගණකකරණය සහ උපකරණ පුවරුවක් (Dash Board) I C T A ආයතනයේ සහාය ඇතිව හඳුන්වා දීම.**

කාර්යක්ෂම සහ ඵලදායී වැඩ පද්ධතියක් බිහිකිරීමේ අරමුණින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය මඟින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සහ උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබා දීමේ ක්‍රියාවලිය සඳහා ඩිජිටල් ලේඛන කළමනාකරණය සහ අභ්‍යන්තර

වැඩ පද්ධතිය පරිගණකකරණය හා උපකරණ පුවරුවක් (Dash Board) I C T A ආයතනයේ සහාය ඇතිව සිදු කරමින් පවතී.

**09. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවම ප්‍රමිතීන් සැකසීම**

රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි සීමිත ඉඩකඩ හේතුවෙන් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය සමත්ව විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් සපුරාලන සිසුන්ගෙන් රාජ්‍ය විශ්ව විද්‍යාලයන් සඳහා අවස්ථා සැලසෙන්නේ සිසුන් 30,000 කට ආසන්න ප්‍රමාණයකට පමණි. රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශය නොලත් සිසුන්ගෙන් 81%ක් පමණ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලින් උසස් අධ්‍යාපනය සඳහා යොමු වෙති.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මෙම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණත්වය පිළිබඳව පොදු මහජනතාවට සහතික විය යුතු වේ. මේ සඳහා නිශ්චිත බලධරයා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නියමයෙන් යුතුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ඇගයීම සඳහා වන ප්‍රතිපත්ති හා නිර්ණායක සැකසීම සඳහා වන විද්වත් පුද්ගලයන්ගෙන් සැඳුම්ලත් කමිටුවක් 2019-01-09 දින පත් කරන ලදී. එම කමිටුව මඟින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල වල තිබිය යුතු අවම ප්‍රමිතීන් (Minimum Standards) පිළිබඳ නිර්ණායකයන් සම්මතයන් සහ ඒ සඳහා වන ප්‍රතිපත්ති පිළිබඳ වාර්තාවක් සකස් කර ඇත. අදාළ වාර්තාව ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුවෙහි අනුමැතියට යොමු කර ඇත.

**10. විදේශ විශ්වවිද්‍යාල / උපාධි ප්‍රදානය කරන ආයතන සමඟ අනුබද්ධිත විදේශ උපාධි පාඨමාලා පවත්වන උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම.**

කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එ සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණය ලෙස තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම යන්න දක්වා ඇත.

**11. උසස් අධ්‍යාපනය සඳහා ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කිරීම.**

පූර්ණ වශයෙන් සෘජු විදේශ ආයෝජනයන් මත ක්‍රියාත්මක උසස් අධ්‍යාපන ආයතනයන් ශ්‍රී ලංකාව තුල ස්ථාපනය කිරීමේදී, මූලික වශයෙන් පහත නිර්ණායකයන් පදනම්ව එම ආයෝජනයන් සඳහා අවසර දීමට ආයෝජන මණ්ඩලය එක්ව උසස් අධ්‍යාපනය සඳහා ආයෝජන ප්‍රතිපත්තියන් සැකසීමට කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

I. ආයෝජන සීමාව (ඩොලර් මිලියන)
II. එම විදේශිය මව් විශ්ව විද්‍යාලය/ අධ්‍යාපන ආයතනයට හිමි පිළිගැනිම.
III. විදේශ සිසුන් බඳවා ගැනීමේ අවම සීමාව.
IV. මෙරට උත්පාදනය වන රැකියා ප්‍රමාණය.

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2017 දී අයවැය යෝජනා යටතේ අනුමත වූ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.**

2017 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍යයන් හට උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි කිරීමේ අරමුණින් පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ රජයේ විශ්වවිද්‍යාලයකට ඇතුලත් වීමේ අවකාශ නොලැබූ සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා ගාස්තු දැරිය නොහැකි ශිෂ්‍යයන් සඳහා, එසේ හදාරනු ලබන සම්පූර්ණ පාඨමාලාව වෙනුවෙන් රු. 800,000ක

උපරිම ණය මුදලක් ලබා දෙනු ඇත. මෙම උපාධි පාඨමාලාවන් පිරිනැමීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගෙන ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දහයක (10) උපාධි පාඨමාලාවන් පනහක් (50) තෝරාගෙන ඇත. මෙම වැඩසටහන මඟින් රටේ ආර්ථික හා මානව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන ඉහළ මට්ටමේ මානව ප්‍රාග්ධනයක් ඇති කිරීමට පහසුකම් සපයන අතරම තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපනයේ යෙදීමට වැඩි අවස්ථාවන් ලබා දේ.

2015 සහ 2016 අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් ලත් සිසුන් පළමු හා දෙවන අධ්‍යයන කණ්ඩායම් යටතේ බඳවා ගන්නා ලදි. 2017 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත තුන්වන අධ්‍යයන කණ්ඩායම 2019 වසරේදී බඳවා ගන්නා ලද අතර මේ වන විට සිසුන් තුන්දහස් හාරසිය හතලිස් තුනක් (3443) පහත සඳහන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දහයෙහි (10) අධ්‍යයන කටයුතු සිදු කරයි.

1. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)
2. ජාතික ව්‍යාපාරික කළමනාකාරීත්ව විද්‍යාලය (NSBM)
3. කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය (CINEC)
4. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ විද්‍යා පීඨය (SIBA)
5. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (ICASL)
6. සණස කැම්පස් ලිමිටඩ් ආයතනය(SANASA)
7. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි පුද්ගලික සමාගම (HORIZON)
8. KAATSU - උසස් වෛද්‍ය තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය
9. ශ්‍රී ලංකා ටෙක්නොලොජිකල් කැම්පස් (SLTC)
10. සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (SAEGIS)

ලංකා බැංකුව මගින් ණය මුදල් ලබා දීමේ කටයුතු සිදු කරනු ලබන අතර 2019 දෙසැම්බර් 31 වන විට සිසුන් 2069 දෙනෙකු සඳහා රු. මිලියන 1,605.01 ක ණය මුදල් අනුමත කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේදී පළමු, දෙවන හා තෙවන කණ්ඩායම් සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. මිලියන 593.10 ක මුදලක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත ගෙවා ඇත. පාඨමාලා ගාස්තු සඳහා වන මෙම ණය මුදලට අමතරව සිසුන්ගේ සාමාන්‍ය වියදම් පියවා ගැනීම සඳහා වන පොලී රහිත ශිෂ්‍යාධාර ණය මුදල සිසුන් 2,764 ක් සඳහා ප්‍රදානය කරන ලද අතර මේ වන විට ඔවුන් කාර්තුමය වශයෙන් රු.18,750/- ක මුදලක් ලබා ගනී.

මෙම ණය සඳහා වන පොළිය වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 64.83 ක් ලංකා බැංකුව වෙත ගෙවා ඇත.

ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රචාරණ කටයුතු රාජ්‍ය පුවත්පත්, ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය අතරතුර චලනමය පුවත් තීරුවෙහි (Newsline)පළ කිරීම, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවිය, අ.පො.ස (උ.පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් හට විද්‍යුත් පණිවිඩ (email) යැවීම සහ සියළුම දුරකථන ජාලයන් ඔස්සේ කෙටි පණිවිඩ යැවීම ආදී ක්‍රමවේදයන් භාවිතයෙන් සිදු කරන ලදී. "Enterprise Sri Lanka" වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය විසින් අනුරාධපුර සහ යාපනය යන ප්‍රදේශවල සංවිධානය කරන ලද ප්‍රදර්ශන දෙකක ශිෂ්‍ය ණය අංශයේ දැනුවත් කිරීමේ කුටි පවත්වාගෙන යන ලද අතර පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා කුරුණෑගල සහ රත්නපුර යන ප්‍රදේශවල සංවිධානය කරන ලද "Edu Expo" ප්‍රදර්ශනයට සහභාගී විය. මීට අමතරව, ඉලක්කගත කණ්ඩායම දැනුවත් කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු උපදේශකවරුන් සහ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් සහ

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ දිස්ත්‍රික් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 11 ක් පවත්වන ලදී.

2016, 2017 හා 2018 වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත පදනම්ව හතරවන කණ්ඩායම බඳවා ගැනීම 2020 දී ආරම්භ කිරීමට නියමිතය. මේ සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇති අතර රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දොළහක (12) උපාධි පාඨමාලාවන් අසූ තුනක් (83) ක් ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට ඇතුලත් වීම සඳහා ඉල්ලුම් කර ඇත. ප්‍රතීතනය හා තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුවේ (SCAQA) සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මගින් සෑම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයකම ආසන ධාරිතාව සහතික කිරීම සඳහා ධාරිතා සමාලෝචනය ආරම්භ කර ඇත.

තවද, ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සියළුම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ආවරණය කරමින් ක්ෂේත්‍ර චාරිකා හා පසු විපරම් සැසි සංවිධානය කිරීම මගින් ශිෂ්‍ය ණය අංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමයේ අධීක්ෂණ වැඩසටහන ආරම්භ කරන ලදී. අධීක්ෂණ වාර්තා ආයතන වෙත යවා ඇති අතර හඳුනාගත් ගැටළු අදාල රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම ගැටළු විසඳීමට පියවර ගෙන ඇත. මීට අමතරව සිය උසස් අධ්‍යාපන අභිලාෂයන් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන සිසුන්ට උපරිම වාසි ලබා දීමේ අරමුණින් මෙම ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීමට අදාළ නවීකරණයන් කිරීම් සැලසුම් කර ඇත. මේ අතර, මාර්ගගත යෙදුම් පද්ධතිය (Online application system) සහ දත්ත සමුදාය (Database) වැඩිදියුණු කිරීම සඳහාත්, සමස්ථ වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහාත්, ප්‍රතිපල ප්‍රගතිය පරීක්ෂා කිරීමටත් පියවර ගෙන ඇත.

# 1.6. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 1.6.1 ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රගතිය

2019 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.

| ආයතනය | | පුනරාවර්ථන වියදම (රු.මි.) | | | ප්‍රාග්ධන වියදම (රු.මි.) | | | මුළු වියදම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන මුදල | වියදම | % | ප්‍රතිපාදන මුදල | වියදම | % | ප්‍රතිපාදන මුදල | වියදම | % |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම | | 46,076 | 45,544 | 99 | 13,120 | 10,010 | 76 | 59,196 | 55,554 | 94 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | 1,760 | 1,742 | 99 | 7,308 | 6,586 | 90 | 9,068 | 8,328 | 92 |
| විදේශිය | | - | - | - | 8,288 | 5,387 | 65 | 8,288 | 5,387 | 65 |
| අයවැය යෝජනා | උ.අ.අ. | 230 | 36 | 16 | 2,146 | 930 | 43 | 2,376 | 966 | 41 |
| | වි.ප්‍ර.කො. | - | - | - | 860 | 810 | 94 | 860 | 810 | 94 |
| මුළු ප්‍රතිපාදන | | 48,066 | 47,322 | 98 | 31,722 | 23,723 | 75 | 79,788 | 71,045 | 89 |

2019 වර්ෂයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන් වූ මුළු ප්‍රාග්ධන වියදම වූ රුපියල් මිලියන 31,722 මුදලින් 37% ක් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති අතර 2018 වර්ෂයේ එය 57% ක් විය. 2019 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් වූ ප්‍රතිපාදන යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 146,276 ක් වූ ව්‍යාපෘති 172 ක් සඳහා රුපියල් මිලියන 11,851 ක් ප්‍රතිපාදන වෙන් වූ අතර 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 116,749 යටතේ ව්‍යාපෘති 170ක් සඳහා රුපියල් මිලියන 18,507 ක් වෙන් විය.

2018 වර්ෂයේ හා 2019වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් වූ ආකාරය පිළිබඳ විග්‍රහයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශීය වැය ශීර්ෂය යටතේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ පහතින් දක්වා ඇත.

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශීය වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන -**

(රු.මි.)

| විශ්වවිද්‍යාලය/ ආයතනය | 2018 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන | වියදම | % | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන | වියදම | % |
| භික්ෂු | 05 | 152 | 132 | 87 | 05 | 223 | 160 | 72 |
| බෞද්ධ හා පාලි | 03 | 77 | 77 | 100 | 05 | 231 | 168 | 73 |
| උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 11 | 200 | 200 | 100 | 05 | 433 | 387 | 89 |
| විදේශීය/දේශීය ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති | 10 | 3,556 | 1,174 | 33 | 08 | 1,480 | 1,015 | 69 |
| අයවැය යෝජනා ව්‍යාපෘති | 06 | 1,442 | 270 | 21 | 10 | 778 | 105 | 13 |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය | 01 | 2,044 | 2,044 | 100 | 01 | 505 | 505 | 100 |
| එකතුව | **36** | **7,471** | **3,897** | **53** | **34** | 3,650 | 2,340 | 64 |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන -**

| විශ්වවිද්‍යාලය/ ආයතනය | 2018 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යා.සංඛ්‍යා | ප්‍රතිපාදන | වියදම | % | ව්‍යා.සංඛ්‍යා | ප්‍රතිපාදන | වියදම | % |
| පේරාදෙණිය | 18 | 535 | 535 | 100 | 22 | 424 | 395 | 93 |
| කොළඹ | 04 | 815 | 768 | 94 | 06 | 551 | 391 | 71 |
| ජයවර්ධනපුර | 07 | 224 | 141 | 63 | 06 | 261 | 102 | 39 |
| කැළණිය | 09 | 500 | 415 | 83 | 09 | 311 | 239 | 77 |
| මොරටුව | 13 | 431 | 192 | 45 | 14 | 315 | 125 | 37 |
| රුහුණ | 05 | 627 | 370 | 59 | 09 | 331 | 54 | 16 |
| යාපනය/වව්නියා මණ්ඩපය | 10 | 572 | 499 | 87 | 08 | 226 | 195 | 86 |
| නැගෙනහිර | 03 | 145 | 145 | 100 | 04 | 187 | 120 | 53 |
| රජරට | 05 | 435 | 145 | 33 | 05 | 319 | 189 | 59 |
| සබරගමුව | 14 | 278 | 224 | 81 | 08 | 280 | 280 | 100 |
| අග්නිදිග | - | - | - | - | 02 | 37 | -* | - |
| වයඹ | 10 | 146 | 88 | 60 | 11 | 168 | 61 | 36 |
| සෞන්දර්ය | 04 | 222 | 79 | 36 | 04 | 180 | 84 | 47 |
| ඌව වෙල්ලස්ස | 04 | 87 | 35 | 40 | 04 | 226 | 222 | 98 |
| විවෘත වි.වි. | 01 | 40 | 40 | 100 | 01 | 30 | 30 | 100 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 05 | 227 | 105 | 46 | 04 | 356 | 290 | 81 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආ. | 01 | 535 | 405 | 76 | 01 | 452 | 397 | 88 |
| වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 02 | 100 | 16 | 16 | 02 | 47 | 4 | 6 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 01 | 44 | 38 | 87 | 01 | 10 | 10 | 100 |
| කොළඹ වි. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා. | 01 | 50 | 49 | 97 | 01 | 22 | 22 | 100 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය | 01 | 90 | 25 | | 01 | 125 | 125 | 100 |
| කාර්ය මණ්ඩල නිල නිවාස ව්‍යාපෘතිය | 01 | 80 | 80 | 100 | 01 | 35 | 15 | 43 |
| තාක්ෂණපීඨ ව්‍යාපෘතිය | 11 | 3,123 | 2,613 | 84 | 11 | 2,458 | 2,110 | 86 |
| අයවැය යෝජනා ව්‍යාපෘති | 04 | 1,730 | 1,014 | 59 | 04 | 850 | 806 | 95 |
| **එකතුව** | **134** | **11,036** | **8,021** | **73** | 138 | 8,201 | 6,141 | 75 |

(මූලාශ්‍ර - ඉදිකිරීම් ව්‍යාපෘති විශ්වවිද්‍යාල වාර්තා 2018.12.31 දිනට හා 2019.12.31 දින

- 2019 වර්ෂයේ තුන්වන කාර්තුවේ ආරම්භ කළ ව්‍යාපෘති

ඉදිකිරීම් ව්‍යාපෘති සංයුතිය - 2019

| | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. | ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|---|---|
| අවසන් බිල්පත් පියවීමට ඇති ව්‍යාපෘති | 58 | 21,586 | 1,792 | 1,392 |
| 2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති | 22 | 5,799 | 1,450 | 1,240 |
| 2019 වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | 66 | 81,959 | 7,390 | 5,608 |
| 2019 වර්ෂයේ නව ව්‍යාපෘති | 26 | 36,932 | 1,219 | 241 |
| එකතුව | 172 | 146,276 | 11,851 | 8,344 |

## 2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති

2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති ගණන 22 කි. මෙම ව්‍යාපෘති 22 තුළ පීඨ ගොඩනැගිලි 09 ක් , නේවාසිකාගාර හා නිල නිවාස 05 ක් , තාක්ෂණ පීඨ 04 ක් සහ ATI මධ්‍යස්ථාන 04 ක් මූලික වශයෙන් ඇතුළත් වේ. 2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති කිහිපයක රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත. ඉදිකිරීම් කටයුතු අවසන් කල ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.



ඉංජිනේරු තාක්ෂණ විද්‍යාගාර ගොඩනැගිල්ල – වයඹ වි. කුලියාපිටිය
ඇ.පි. රු.මි. 282



ශරීර සුවතා මධ්‍යස්ථානය - යාපනය විශ්වවිද්‍යාලය
ඇ.පි. රු.මි. 242



කළමනාකරණ හා මූල්‍ය පීඨයේ "West Wing" ගොඩනැගිල්ලේ දිගුව - කොළඹ වි. - ඇ.පි. රු.මි. 290




කෘෂිකර්ම හා වතු කළමණාකරණ පීඨය අදියර 111 - වයඹ වි. කුලියාපිටිය
ඇ.පි. රු.මි. 233



තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම - අග්නිදිග විශ්වවිද්‍යාලය ඇ.පි. රු.මි. 450.8



කළමනාකරණ හා මූල්‍ය පීඨයේ "East Wing " ගොඩනැගිල්ලේ දිගුව - කොළඹ වි. - ඇ.පි. රු.මි. 130

## ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති

2019 වර්ෂයට පෙර ආරම්භ කර ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති ගණන 66කි. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 81,959ක් වන මෙම ව්‍යාපෘති සඳහා 2019 වර්ෂයේ රුපියල් මිලියන 7,390ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2019 වර්ෂය අවසන් වන විට වන විට මෙම ප්‍රතිපාදනයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 5,608කි. තවද මෙම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 18ක භෞතික ප්‍රගතිය 80% ඉක්මවා ඇත.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට බඳවා ගන්නා විද්‍යාර්ථීන් සංඛ්‍යාව මූලික වශයෙන් වැඩි කරන ක්ෂේත්‍ර වන වෛද්‍ය, තාක්ෂණ, විද්‍යා හා කළමණාකරණ යන අංශ පාදක කරගෙන ආරම්භ කළ පීඨ මූලික වශයෙන් මෙයට අයත් වේ. එනම් තාක්ෂණ පීඨ ව්‍යාපෘතිය හා වයඹ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙයට උදාහරණ වේ. මීට අමතරව විදේශ ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා ඉදිවන පර්යේෂණ හා පුහුණු ගොඩනැගිලි සංකීර්ණය යන ව්‍යාපෘති ද ඇතුළත් වේ. ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති නාම ලේඛනය ඇමුණුම 2 මගින් දක්වා ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,000 ඉක්මවන ලද ව්‍යාපෘති කිහිපයක තොරතුරු පහත දක්වා ඇත.

### 01. තාක්ෂණ පීඨ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2016 අයවැය යෝජනා ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වේ. තාක්ෂණ විෂය ධාරාවේ නව පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නව පීඨයන් මෙන්ම පවත්නා පීඨයන්හි නව දෙපාර්තමේන්තු සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2019 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 3,100 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් වෙන්වන ප්‍රතිපාදන්හි ප්‍රගතිය පහතින් දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාල සතරක පීඨයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර එම පීඨයන්හි රූප සටහන් 2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති යටතේ දක්වා ඇත.

ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින තාක්ෂණික පීඨයන්හි රූප සටහන් පහත දක්වා ඇත.



ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි හා අදාළ ව්‍යුහයන්- යාපනය විශ්වවිද්‍යාලය, ඇ.පි. රු.මි. 525



අධ්‍යයන ගොඩනැගිලි කොටස C - තාක්ෂණ පීඨය කොළඹ වි.

**තාක්ෂණ පීඨ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019.12.31 දිනට ප්‍රගතිය**

| විශ්වවිද්‍යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | සමුච්චිත වියදම | සමුච්චිත භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර | තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ල | 3,073.5 | 2,043.0 | 86 |
| යාපනය | ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි හා අදාළ ව්‍යුහයන් | 525.0 | 342.0 | 65 |
| වව්නියා | ව්‍යවහාරික විද්‍යා පීඨයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා ද්වි මහල් ගොඩනැගිල්ල හා අදාළ ව්‍යුහයන් | 200.0 | 200.0 | 100 |
| රජරට | තාක්ෂණික අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණය අදියර II & III | 438.0 | 41.0 | 10 |
| රුහුණු | තාක්ෂණ අධ්‍යයන අංශය, විද්‍යා පීඨය | 691.8 | 604.1 | 95 |
| කොළඹ | තාක්ෂණ පීඨයක් ඉදි කිරීම | 2,087.0 | 1,261.0 | 70 |
| වයඹ | ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන හඳුන්වා දීම සඳහා විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම – කුලියාපිටිය | 282.0 | 215.5 | 100 |
| වයඹ | කෘෂිකර්ම හා වතු කළමණාකරණ පීඨය අදියර iii | 233.0 | 177.3 | 100 |
| ඌව | තාක්ෂණ ධාරාවේ උපාධි වැඩසටහන් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය 2016 (සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම) | 316.0 | 217.3 | 82 |
| නැගෙනහිර | ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් සැලසුම් කර ඉදි කිරීම | 239.5 | 228.3 | 100 |
| අග්නිදිග | තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම | 450.8 | 418.0 | 100 |
| එකතුව | | **8,223.3** | **5,747.5** | |

## 02. වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - වයඹ විශ්වවිද්‍යාලය (2016 අයවැය යෝජනා)

වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ සිට කිලෝමීටර් 5ක පමණ දුරින් ද, ශික්ෂණ රෝහල ලෙස යොදා ගන්නා කුලියාපිටිය මූලික රෝහලේ සිට කිලෝමීටර් 1.5ක දුරින් ද පිහිටි මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වූ අක්කර 28ක භූමි ප්‍රදේශයක් උපයෝගී කරගනිමින් වෛද්‍ය පීඨය ස්ථාපිත කරන ලදී.

ඉඩම සඳහා වන්දි ගෙවීමට රුපියල් මිලියන 70ක් ද, වෛද්‍ය පීඨ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් 2,341.4ක් ද අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 818ක් ද ලෙස මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3,229.4ක් වූ මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2019 වර්ෂයේදී නිම කිරීමට යෝජිතය.

අදියර හතරක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර හතරක්, මහල් සතරකින් සමන්විත ගොඩනැගිල්ල, පරිපාලන ගොඩනැගිල්ල, කාර්යය මණ්ඩල නිල නිවාස, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, ශ්‍රවණාගාරය, පුස්තකාලය, නේවාසිකාගාරය, ආපනශාලාව, සෞඛ්‍ය මධ්‍යස්ථානය, ව්‍යායාම මධ්‍යස්ථානය, යන ගොඩනැගිලි ඉදිකිරීමට නියමිතය. මෙම වෛද්‍ය පීඨය මගින් වර්ෂයකට සිසුන් 75 දෙනෙකු ඇතුළත් කර ගන්නා අතර 2019 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වලින් 90%ක් වැඩ නිම කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් වන මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේ රුපියල් මිලයන 600ක් වෙන් කර ඇත. වෛද්‍ය පීඨයේ වර්තමාන ප්‍රගතතිය ඇතුළත් රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.






## 03. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ 2016.03.24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම මගින් කුවේට් ඩිනාර් මිලියන 10ක් ණය මුදලක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 6,354ක් වන අතර මුළු සමුච්චිත වියදම රුපියල් මිලියන 786 කි. 2019 වර්ෂයට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 858.5ක් වෙන් කර ඇති අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 30%කි.

මෙම ව්‍යාපෘතිය නිමකළ පසු වෛද්‍ය උපාධිය සඳහා 100ක් ද, හෙද උපාධිය සඳහා 70ක් ද, ඖෂධවේදී උපාධිය සඳහා 20ක් ද, මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය සඳහා 20ක් ද වශයෙන් වාර්ෂිකව මෙම පීඨයට විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීමට හැකි වනු ඇත.

## 04. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

2018 වර්ෂයේ ආරම්භ කළ මහා පරිමාණ ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. `ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 26,400කි. මෙයින් රුපියල් මිලියන 23,200ක් ආසියානු සංවර්ධන බැංකුවෙ ණය ආධාර යටතේ ද, ඉතිරි මුදල් දේශීය අරමුදල් යටතේ ද මූල්‍යයනය කිරීමට සැලසුම් කර ඇත.
මෙම ව්‍යාපෘතිය යටතේ කැලණිය, සබරගමුව , රජරට යන විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණ පීඨ ස්ථාපිත කිරීමටත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීමටත් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් එක් එක් විශ්වවිද්‍යාල සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ , උපකරණ , පොත්පත් හා අවශ්‍ය මෘදුකාංග සහිත අංගසම්පූර්ණ ගොඩනැගිලි සංකීර්ණයක් ස්ථාපිත කෙරේ.

උක්ත විශ්වවිද්‍යාලයන්හි නව පීඨ ආරම්භ කිරීම මගින් විද්‍යාර්ථීන් 850ක් ඇතුළත් කර ගැනීමට යෝජිතය. 2018 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ.

ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ,

- නව්‍ය තාක්ෂණික ඉගෙනුම් සහ පර්යේෂණ පරිසරයක් ඇති කිරීම
- ගුණාත්මක සහ කර්මාන්තයට අදාළ උසස් තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කර්මාන්ත හා සබඳතා සහ ජාත්‍යන්තර සහයෝගීත්වයන් සවිමත් කිරීම
- පීඨ කළමනාකරණ ධාරිතාව සවිමත් කිරීම
- නව උසස් අධ්‍යාපන වැඩසටහනක් සැකසීම සඳහා සහාය වීම

## 05. වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP)

වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ (WUTDP) අරමුණ නම් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ අවට ජීවත් වන ප්‍රජාවන් අතර සමීප අන්තර් සබඳතා වැඩි දියුණු කිරීම මඟින් හා රටෙහි උසස් අධ්‍යාපන පද්ධතිය හරහා පිරිනමනු ලබන පහසුකම් තුළින් ග්‍රාමීය-නාගරික සබඳතාව සවිමත් කිරීම මඟින් වයඹ විශ්වවිද්‍යාලය පිහිටි පරිශ්‍රය වටා ඇති විශාල වපරිසරයක් පුරා සුවිශේෂ සංවර්ධන බලපෑමක් ඇති කිරීම ය.
වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය සංරචක හතරකින් සමන්විත වේ:

(1) විශ්වවිද්‍යාල ගොඩනැගිලිවල දළ වශයෙන් වර්ග මීටර් 20,000ක වර්ගඵලයකින් යුත් සිවිල් වැඩ

(2) දැනට ක්‍රියාත්මක උපාධි වැඩසටහන් සඳහා අත්‍යඅවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය

(3) ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා

(4) වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අතිරේක වැඩ ලෙස සලකමින් ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 60 ( සෞදි රියාල් මිලියන 225) වන අතර එයින් ආසන්න වශයෙන් ඇමරිකන් ඩොලර් මිලියන 28ක් (රු.මි. 105ක්) සංවර්ධනය සඳහා වන සෞදි අරාබි පදනම මඟින් මූල්‍යයනය කරනු ඇත.

## 06. කොළඹ විශ්වවිද්‍යාලයේ පූර්ව ශායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන විශාලතම ව්‍යාපෘතියක් ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඉදිවන පූර්ව ශායනක ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය දැක්විය හැක. ලංකා බැංකුව විසින් ලබාදෙන ණය යටතේ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවති. එම නිසා ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු මෙම ණය මුදල් පියවීමට නියමිත අතර එතෙක් මෙම ප්‍රතිපාදන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයකට ඇතුළත් කර නොමැත.

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඉදිවන පූර්ව ශායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ යටතේ අදියර I සහ II ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 6,604ක් වන අදියර IIIහි ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කළ අතර, 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය. වර්ථමාන ප්‍රගතිය දැක්වෙන රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.





### 2019 වර්ෂයේ ආරම්භ කළ නව ඉදිකිරීම් ව්‍යාපෘති

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 36,932ක් වටිනා නව ව්‍යාපෘති 26 ක් සඳහා 2019 වර්ෂයේ රුපියල් මිලියන 1,219 ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ව්‍යාපෘති 26 තුල මූලික වශයෙන් 2019 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,000 ට වැඩි ව්‍යාපෘතිය හා පීඨ ගොඩනැගිලි 10 ක් හා පරිපාලන ගොඩනැගිලි, දේශන ශාලා යන ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ. මෙම වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතින්හි තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම් 3 මඟින් දක්වා ඇත.

2019 වර්ෂයේ අවසන් බිල්පත් ගෙවීමට ඇති ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 04 මඟින් දක්වා ඇත.

## 1.6.2 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන අයවැය යෝජනා ව්‍යාපෘති

### 1. රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2017 අයවැය යෝජනා යටතේ අනුමත වූ රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදීද රු.මිලියන 320 ක මුදලක් වෙන් කර ඇත.වර්ග මීටර් 7,750ක් වූ මෙම ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,179.7 කි. වර්ෂ දෙකකින් සම්පූර්ණ කල යුතු මෙම ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් වටිනාකම වැට් රහිතව රු.මිලියන 850කි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇතුලත් කර ගන්නා වෛද්‍ය සිසුන් සංඛ්‍යාව 160සිට වසරකට සිසුන් 10 බැගින් වසර 4ක් තුලදී සිසුන් 40කින් වැඩි කර වාර්ෂිකව ඇතුලත් කර ගන්නා සිසුන් ගණන 200 ක් කිරීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 299.4 ක් ගෙවීම් කර ඇති අතර Piles ඉදිකිරීමේ වැඩ සිදු කරමින් ඇත.

### 2. සබරගමුව සහ මොරටුව විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීම

වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා පවතින ඉහල ඉල්ලුම සපුරාලීම සඳහා අවස්ථාවන් ලබා දීමට රජය කටයුතු කරමින් සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 අයවැය මගින් සබරගමුව සහ මොරටුව විශ්වවිද්‍යාල සඳහා වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීමට යෝජනා විය.

**සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීම**

ඒ අනුව 2018 වසරේදී සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කටයුතු ආරම්භ කල අතර 2019 ජනවාරි මාසයේදී සිසුන් 75දෙනෙකුගෙන් සමන්විත ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පලමු සහ තෙවන අදියර දේශීය ප්‍රතිපාදන යටතේ ඉදි කෙරෙන අතර දෙවන අදියර සෞදි සංවර්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක විමට නියමිතය. පලමු අදියර යටතේ 2018 සහ 2019 වර්ෂ සඳහා රු.මි. 86ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇත. දෙවන අදියර යටතේ සෞදි සංවර්ධන අරමුදලෙන් අරමුදල් සපයා ගැනීම සඳහා 2019.09.18 වන දින ණය ගිවිසුම් අත්සන් කරන ලදී

**මොරටුව විශ්විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීම**

කුවේට් සංවර්ධන අරමුදල මඟින් ලබා ගන්නා ණය මුදලක් මඟින් මෙම පීඨය ඉදි කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මේ වන විට ණය ගිවිසුම පිළිබඳ සාකච්ඡා කරමින් සිටී.

### 3. රුහුණ විශ්වවිද්‍යාලයේ නාවික අධ්‍යයන කේන්ද්‍රයක් ඇති කිරීම

2018 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙස අනුමත වූ මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 943 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2019 වසර සඳහා රු.මි.125ක මුදලක් වෙන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා නාවුක ඉංජිනේරු සහ නාවුක ගෘහ නිර්මාණ ශිල්පය යන පාඨමාලා සඳහා පහසුකම් සැපයීම, යාත්‍රා ඉදිකිරීමේ කටයුතු සඳහා පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සැපයීම, එම අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂා කරන අතර විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන්100 දෙනෙකුගෙන් පමණ ඉහල යනු ඇතැයි ද අපේක්ෂා කරයි. 2019 වසරේ දී රු. මි 67.5ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇත.

**4. රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ඇති කිරීම**

2018 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙස අනුමත වූ මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 1,300 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2019 වසර සඳහා රු.මි.50ක මුදලක් වෙන් කරන ලදී. වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ලබා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම, අධ්‍යන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්, විද්‍යාගාර සහ භෞතික සම්පත් වර්ධනය කිරීම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂිතය.

**5. කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය සඳහා ආධාර ලබා දීම**

2018 අයවැය යෝජනා යටතේ අනුමත වූ මෙම ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මි.65ක් වූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.63ක මුදලක් ලබා දී ඇත. මේ යටතේ හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගනිමින් කෘෂිකාර්මික නවෝත්පාදන සඳහා පර්යේෂණ සිදු කිරීම, අධ්‍යයන අවස්ථා ලබා දීම සහ ඊට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිම ආදිය සිදු කෙරේ. 2019 වර්ෂය සඳහා රු. මි. 38ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇත.

**6. දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය ස්ථාපනය කිරීම**

2017 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් වූ මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 250 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මේ සඳහා රු.මි.10ක මුදලක් ලබා දී ඇත. ආයුර්වේද වෛද්‍ය සේවයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් හට අවශ්‍ය පර්යේෂණ පහසුකම්, පුහුණු සහ උපදෙස් ලබා දීම ආදිය මෙන්ම සිද්ධ වෛද්‍ය විද්‍යාව සහ යුනානි වෛද්‍ය විද්‍යාව පිලිබඳ විශේෂඥ දැනුමැති ආයුර්වේද වෛද්‍යවරුන් බිහි කිරීමට දායකත්වය සැපයිම මෙම ආයතනයේ පරමාර්ථ අතර වේ. බොරැල්ල ආයුර්වේද රෝහලේ පස්වන මහලෙහි මෙම ආයතනය ස්ථාපිත කර ඇත.

**7. උසස් අධ්‍යාපනය සඳහා ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන යාන්ත්‍රණයක් ඇති කිරීම**

උසස් අධ්‍යාපනය සඳහා තිරසාර තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන යාන්ත්‍රණයක් නොමැති වීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයේ ප්‍රගතියට විශාල බලපෑමක් වී ඇත. මෙම අඩුපාඩුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධතියේ වර්ධනය සඳහා බොහෝ සෙයින් බලපා ඇති අතර එය ශ්‍රී ලංකාව කලාපීයව හා ජාත්‍යන්තර වශයෙන් උසස් අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රත්‍යක්ෂ නොවීමට ද හේතු වී ඇත. මෙම ගැටලුවට පිළියමක් වශයෙන් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද දායකත්වය සහිතව උසස් අධ්‍යාපනය සඳහා නව ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන අධිකාරියක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර එය 2018 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙසද ඉදිරිපත් විය.2019 වසර සඳහා රු.මි.10ක ප්‍රතිපාදන මේ සඳහා වෙන් කරන ලදි.

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

1 සියලුම සුදුසුකම් සහිත සිසුන්හට උපාධි මට්ටම දක්වා අඛණ්ඩ උසස් අධ්‍යාපනයක් ලබා දීම .

2 උපාධිධාරීන්ගේ වඩා හොඳ සේවා නියුක්තිය සඳහා උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය වැඩි දියුණු කිරීම.

3 තාක්‍ෂණික පදනම් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම, තාක්‍ෂණය ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායකත්වය, පර්යේෂණ ප්‍රතිලාභ වාණිජකරණය කිරීම, දැනුම ව්‍යාප්ත කිරීම,(සෞභාග්‍යයේ දැක්ම- 06 වන පරිච්ඡේදය)

4 උසස් අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාව හා සඵලතාවය වැඩි දියුණු කිරීම.

5 උසස් අධ්‍යාපනය ජාත්‍යන්තරකරණය කිරීම

**<u>2025 වසර දක්වා වන මධ්‍ය කාලීන උසස් අධ්‍යාපන ප්‍රවේශ පුළුල් කිරීමේ ඉලක්කයන්</u>**

| මූලික සංවර්ධන ප්‍රවේශය | ඉලක්ක ගත උසස් අධ්‍යාපන අවස්ථා සංඛ්‍යාව |
|---|---|
| ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය යටතේ බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 30,000 සිට 40,000 දක්වා වැඩි කිරීම | 40,000 |
| රැකියා වෙළඳපල ඉලක්ක කරගත් රැකියා අභිමුඛ සති අන්ත සහතික පත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දීම (අවම වශයෙන් එක් විශ්ව විද්‍යාලයකට ශිෂ්‍යයන් 1500 ක්) | 30,000 |
| යෝජිත දිස්ත්‍රික් විශ්වවිද්‍යාල 10කි. දැනට විශ්වවිද්‍යාල ස්ථාපනය වී නොමැති දිස්ත්‍රික්ක වල ස්ථාපනය කිරීම | 15,000 |
| එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් තෝරාගත් මහින්දෝදය විද්‍යාගාර 300 ක පස්වරු පාඨමාලා හඳුන්වාදීම (එක් විද්‍යාගාරයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 බැගින්) | 30,000 |
| ලාභ නොලබන පරමාර්ථය කොටගත් වරලත් විශ්ව විද්‍යාල ඇති කිරීම යටතේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම. | 30,000 |
| රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතිය තවදුරටත් ප්‍රමිති ගත කොට පුළුල් කිරීම | 20,000 |
| ජාතික උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පද්ධතිය (SLIATE) වරලත් විශ්ව විද්‍යාලයක් ලෙස උසස් කිරීම | 15,000 |
| දියතලාව නව විශේෂිත ජාතික විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම | 120 |
| ජාතික වන සම්පත් , පාරිසරික අධ්‍යාපන හා පරිසර සංරක්ෂණ පිළිබඳ වරලත් විශ්ව විද්‍යාලය ස්ථාපනය | 120 |
| ජාතික කෘෂි පර්යේෂණ හා ජෛව පද්ධති තාක්ෂණික වරලත් විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම | 300 |
| හම්බන්තොට සහ සීතාවක ජාතික අධි තාක්ෂණික අධ්‍යන වරලත් විශ්ව විද්‍යාලය | 1,500 |
| පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම (5000 සිට 15000 දක්වා) | 15,000 |
| එකතුව | 197,040 |

..................................
ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී
දිනය: [illegible]

අනුර දිසානායක
ලේකම්
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

ඒසීඒ-එෆ්

# 03. පරිච්ඡේදය - 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2018 |
|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - |
| - | ආදායම් බදු | 1 | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 7,743,935,902 | 7,826,691,658 |
| - | තැන්පතු | | 40,111,693 | 132,990,765 |
| - | අත්තිකාරම් ගිණුම් | | 5,391,267 | 4,220,704 |
| - | වෙනත් ලැබීම් | | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **7,789,438,862** | **7,963,903,126** |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **7,789,438,862** | **7,963,903,126** |
| | **අඩුකළා : වියදම්** | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | |
| 81,400,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 77,229,547 | 89,556,201 |
| 94,594,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 89,085,823 | 101,026,552 |
| 1,813,794,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,611,738,931 | 1,316,833,507 |
| - | පොළී ගෙවීම් | 8 | 0 | 0 |
| 212,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 211,284 | 0 |
| **1,990,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **1,778,265,585** | **1,507,416,260** |
| | **මූලධන වියදම්** | | | |
| 25,100,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 25,100,000 | 6,593,503 |

| | | | | |
|---|---|---|---|---|
| 14,633,871,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 10,698,801,469 | 7,967,846,061 |
| 1,887,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,135,322,199 | 878,365,000 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 0 | 0 |
| 354,976,000 | හැකියා වර්ධනය | 14 | 307,519,886 | 615,569,629 |
| 841,073,000 | වෙනත් මූලධන වියදම් | 15 | 736,738,306 | 868,254,750 |
| **17,742,020,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **12,903,481,860** | **10,336,628,944** |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **95,302,268** | **261,230,855** |
| | තැන්පතු ගෙවීම් | | 86,098,370 | 253,503,446 |
| | අත්තිකාරම් ගෙවීම් | | 9,167,840 | 7,499,236 |
| | වෙනත් දෙපාර්තමේන්තු සඳහා ගෙවීම් | | | |
| | ර.ආ. ආපසු ගෙවීම් | | 36,059 | 228,174 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **14,777,049,713** | **12,105,276,059** |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)** | | **-6,987,610,850** | **-4,141,372,932** |

**ඒසීඒ-පී**

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2019.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2019** | **2018** |
| | - - | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | - - |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,596,436,528 | 8,084,450,764 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 262,813,353 | 16,573,592 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 2,497,539 | 3,375,868 |
| **මුළු වත්කම්** | | **1,861,747,420** | **8,104,400,224** |

| | | | |
|---|---|---|---|
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | -225,547,756 | -273,732,421 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,596,436,528 | 8,084,450,764 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 244,041,772 | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 244,319,337 | 290,306,013 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 2,497,539 | 3,375,868 |
| **මුළු වගකීම්** | | **1,861,747,420** | **8,104,400,224** |

* ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් අත්සන් කරන ලද2019.12.31 දිනට මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය ඇමුණුම 05 හි ඇතුලත් වේ.

**ඒසීඒ-සී**

## 3.3. මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය

**මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | තත්‍ය | |
|---|---|---|
| | **2019**<br>රු. | **2018**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 7,738,608,056 | 7,822,016,063 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **7,738,608,056** | **7,822,016,063** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 156,176,646 | 180,493,776 |
| සහනාධාර සහ මාරුකිරීම් | 37,050,931 | 17,333,158 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම | 18,892,134 | 10,082,215 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,497,539 | 3,375,868 |

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **214,617,250** | **211,285,017** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **7,523,990,805** | **7,610,731,046** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 655,983 | 273,798 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **655,983** | **273,798** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 2,027,181,926 | 3,093,028,349 |
| අත්තිකාරම් ගෙවීම් | 9,167,840 | 7,499,236 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,036,349,766** | **3,100,527,585** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(2,035,693,783)** | **(3,100,253,787)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **5,488,297,022** | **4,510,477,259** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 40,111,693 | 132,990,765 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **40,111,693** | **132,990,765** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | 5,442,310,346 | 4,389,964,578 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පත් ගෙවීම් | 86,098,370 | 253,503,446 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **5,528,408,716** | **4,643,468,024** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(5,488,297,022)** | **(4,510,477,259)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,227,000,000 | 1,990,000,000 | 1,778,265,585 | 89% |
| ප්‍රාග්ධන | 16,305,000,000 | 17,742,020,000 | 12,903,481,860, | 73% |

## 3.5. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 76,922,000.00 | 76,922,000.00 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 374,861,933.99 | 374,861,933.99 | - | 100% |
| 9153 | ඉඩම් | 794,700,000.00 | 794,700,000.00 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 349,952,593.95 | 349,952,593.95 | - | 100% |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.6 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 06 හි දක්වා ඇත.

# 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ෂක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| උපාධිධාරී රැකියා නියුක්ත භාවය. | _ | – | 60% |
| ජාතික උසස් අධ්‍යාපන පද්ධතිය වෙත සිසුන් ඇතුලත් කර ගැනීමේ වැඩිවීම. | 2019 වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලට පද්ධතිය වෙත සිසුන් ඇතුලත් කර ගැනීමේ ගණනය කිරීම් තවමත් සිදුකර නොමැත. | – | |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 4.3 2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම. | • පොළී රහිත ශිෂ්‍යාණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.<br>• ජාතික උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.<br>• විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.<br>• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.<br>• ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම. | ඇතුලත් කර ගන්නා සිසුන් ගණනේ වැඩිවීම | 41.38%<br>10.4%<br>18.5% | 60% | 147% |
| 4.5 2030 වන විට<br>I. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම.<br>II. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම<br>III. අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනිමට අවස්ථාව සැලසීම. | • ඉලක්ක සපුරා ඇත.<br>• ඉලක්ක සපුරා ඇත.<br>• මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ. | | | | 100%<br>100%<br>- |

| ඉලක්කය/ අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 4.7 2030 වන විට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධන ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවයන් ලබා ගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම් , සාමය සහ ප්‍රචන්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසි භාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | - | - | - | - | - |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

**තිරසර සංවර්ධන අරමුණු (SDG) 4.5 සපුරා ගැනීම සම්බන්ධව.**

1. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම.

   උසස් අධ්‍යාපන අවස්ථා සඳහා තෝරා ගැනීම හුදෙක් Z-අගය මත රඳා පවතී. එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් නොවේ.

2. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම. -

   උසස් අධ්‍යාපනයේ එක් එක් මට්ටම් අර්ථ දක්වා ඒ සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය සුදුසුකම් ද දක්වා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) මත සකස් කර ඇත. ඒ අනුව සුදුසුකම් සපුරා ලන ඕනෑම අයෙකුට විවිධ මට්ටම් වලට ප්‍රවේශ වීමට ඇති අවස්ථාවන් තහවුරු කර තිබේ. අමාත්‍යංශය යටතෙහි වූ සියළුම අධ්‍යාපන ආයතනයන් මෙම රාමුවට අනුගත කර ඇත.

3. අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට - වෘත්තීය පුහුණුව ලබාගැනිමට අවස්ථාව සැලසීම.

   මෙම අමාත්‍යංශයේ විෂය පථයට අයත් නොවේ.

## 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 28 | 23 | 05 |
| තෘතීයික | 06 | 03 | 03 |
| ද්විතියික | 132 | 68 | 64 |
| ප්‍රාථමික | 45 | 40 | 05 |

6.2 ** ඉහත වගුවේ දක්වා ඇති සේවක සංඛ්‍යාවට අමතරව උපාධිධාරි අභ්‍යාසලාභීන් 36 දෙනෙකු මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව පවතින සත්‍ය පුරප්පාඩු ප්‍රමාණය 41කි. මෙලෙස තනතුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් එක් නිලධාරියෙකුට විෂයන් කිහිපයක කාර්යයන් ඉටු කිරීමට සිදුවීම නිසා අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම දුෂ්කර වී ඇත. එබැවින් අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs’000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| විදේශ අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල මූල්‍ය කළමනාකරණය | 1 | දින 2 | 13 | - | දේශීය | විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය කටයුතුසිදු කිරීම සම්බන්ධයෙන් හා අවසන් ගිණුම් සකස් කිරීම සම්බන්ධයෙන් දැනුවත් වීම |
| කණ්ඩායම් ධාරිතා සංවර්ධන හා නායකත්ව පුහුණු දෙදින බාහිර වැඩමුළුව | 83 | දින 2 | 747 | - | දේශීය | කාර්ය මණ්ඩලයේ නායකත්ව ගුණාංග සහ කුසලතා වැඩිදියුණු වීම |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම | 2 | දින 2 | - | - | දේශීය | රජයේ නිලධරයන්ගේ නිවාඩු,වැටුප්, දීමනා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන පිළිබඳව දැනුවත් වීම |
| රාජ්‍ය අංශයේ විනය කාර්ය පරිපාටිය | 2 | දින 2 | - | - | දේශීය | නිවැරදිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට මඟ පෙන්වීම හා විනය පරීක්ෂණ පිළිබඳ දැනුවත් වීම |
| රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති | 4 | දින 1 | - | - | දේශීය | බඳවාගැනීම් පරිපාටි සකස් කිරීම, උසස් වීම් පරිපාටි සකස් කිරීම, මුදාහැරීම්, සේවයෙන් පහ කිරීම් ආදිය පිළිබඳව දැනුවත් වීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ප්‍රසම්පාදන හා ලංසු ඇගයීම් හඳුන්වාදීම සහ ලංසු ඇගයීම් වාර්තාව සකස් කිරීම | 1 | දින 3 | 12 | - | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හඳුනාගැනීම හා ලංසු ඇගයීම් වාර්තාව සකස් කිරීමේ නිවැරදි ක්‍රමවේදය එදිනෙදා රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අදාල කර ගැනීම |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම | 1 | දින 2 | - | - | දේශීය | භාෂා ප්‍රතිපත්තිය, විනය, වන්දි හා දීමනා සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පරිපාටි සකස් කිරීම පිළිබඳව දැනුවත් වීම |
| ආයතනික ප්‍රසම්පාදන හා සැලසුම් ජාල කළමනාකරණය | 1 | දින 1 | 4 | - | දේශීය | අමාත්‍යාංශයේ මිලදීගැනීම් හා සැපයුම් කටයුතු වලදී නවීන කළමනාකරණ ක්‍රම භාවිතා කිරීම තුළින් කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීම |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 1 | දින 1 | 8 | - | දේශීය | නව ගොඩනැගිලි ඉදි කිරීමේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නවීන තක්ෂණය යොදා ගැනීමට කටයුතු කිරීම |
| බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල වැදගත්කම | 1 | දින 1 | - | - | දේශීය | බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල වැදගත්කම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් වීම |
| විශිෂ්ය වාර්ෂික වාර්තා හා ගිණුම් සම්මාන තරඟය | 5 | දින 1 | 20 | - | දේශීය | නිවැරදි ආකෘතියට අනුව වාර්ෂික වාර්තාවක් සකස් කිරීම සම්බන්ධයෙන් දැනුවත් වීම |
| විනය කාර්ය පරිපාටිය | 1 | දින 2 | 8.5 | - | දේශීය | නිවැරදිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට මඟ පෙන්වීම හා විනය පරීක්ෂණ පිළිබඳ දැනුවත් වීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ප්‍රවාහන කළමනාකරණය | 1 | දින 2 | 8.5 | - | දේශීය | ආයතනයේ වාහන නිසි පරිදි නඩත්තු කිරීම, ප්‍රවාහන අවශ්‍යතා නිසි පරිදි කළමනාකරණය |
| විනය කාර්ය පරිපාටිය | 1 | දින 2 | 8.5 | - | දේශීය | නිවැරදිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට මහ පෙන්වීම හා විනය පරීක්ෂණ පිළිබඳ දැනුවත් වීම |

* රාජකාර් කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම සඳහා නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනය සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමෙන් නව විෂය කරුණු සම්බන්ධයෙන් දැනුම වර්ධනය වන අතර කාර්යක්ෂම සේවාවක් එමඟින් ඉටු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | _ | _ |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | _ | _ |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | _ | _ |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | _ | _ | _ |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | _ | _ | _ |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | _ | _ | _ |
| 1.6 | වෙනත් | _ | _ | _ |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | _ | _ |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | _ | _ |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | _ | _ |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | _ | _ |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | _ | _ |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | _ | _ |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | _ | _ |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | _ | _ |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | _ | _ |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | _ | _ |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | - | - | - |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | _ | _ |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | _ | _ |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | _ | _ |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8 | **වත්කම් කළමනාකරණය** | | _ | _ |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | _ | _ |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | _ | _ |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | _ | _ |
| 9 | **වාහන කළමනාකරණය** | | _ | _ |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | _ | _ |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | _ | _ |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | _ | _ |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | _ | _ |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | _ | _ |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | _ | _ |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල නොවේ | _ | _ |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | _ | _ |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | _ | _ |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | සේවය අතහැර ගොස් ඇති නිළධාරීන් දෙදෙනෙකු හා විශ්‍රාම ගිය නිළධාරියෙකුගේ ණය ශේෂය නිරවුල් කර නොතිබීම - සේවය අතහැර ගොස් සිටි නිළධාරීන් දෙදෙනාට නීති මගින් කටයුතු කිරීමට පියවර ගෙන ඇති අතර විශ්‍රාමික නිලධාරියා මිය ගොස් ඇති අතර ඔහුට විශ්‍රාම පාරිතෝෂිකයක් නොමැති නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් මරණ පාරිතෝෂිකයන් හෝ වෙනත් දීමනා මගින් එම ණය ශේෂය අඩු කරන ලෙස ඉල්ලා වි.වැ. දෙ. අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | _ | _ |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | _ | _ |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | _ | _ |
| **14** | **අග්‍රිම ගිණුම** | | _ | _ |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | _ | _ |
| **15** | **ආදායම් ගිණුම** | | _ | _ |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | _ | _ | _ |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | – | – | – |
| 15.3 | මූ.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | – | – | – |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | – | – |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | – | – |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | – | – |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | – | – |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | අනුකූල වේ | – | – |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | – | – |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | – | – |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | – | – |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | අනුකූල වේ | – | – |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | – | – |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | – | – |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | – | – |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | – | – |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | – | – |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | – | – |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | – | – |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | – | – |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | – | – |